2024

# පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව

**2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනතේ 52 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.**

**ලේකම්**
**මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය**

**2024 ඔක්තෝබර් 14**

# පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය
# පිළිබඳ වාර්තාව 2024

2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ
52 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

ලේකම්

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ
සංචාරක අමාත්‍යාංශය

**2024 ඔක්තෝබර් 14**

# පටුන

| | | පිටු අංක |
|---|---|---|
| 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52 (6) (අ) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශය | | 1 |
| 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52 (6) (ආ) වගන්තිය යටතේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශය | | 3 |
| 1. | හැඳින්වීම | 5 |
| 2. | සමාලෝචනය | 6 |
| 3. | 2024 වසරේ ආර්ථික ප්‍රවණතා | 7 |
| 4. | රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් 2024 | 11 |
| | 4.1 රාජ්‍ය ආදායම | 13 |
| | 4.2 රාජ්‍ය වියදම | 18 |
| | 4.3 භාණ්ඩාගාර මෙහෙයුම් | 21 |
| | 4.4 විදේශ මූල්‍යයනය | 23 |
| | 4.5 රාජ්‍ය ණය | 26 |
| 5. | ආර්ථිකයේ ඉදිරි දැක්ම | 27 |
| 6. | අයවැය දැක්ම 2024 | 29 |
| | 6.1 ආදායම | 29 |
| | 6.2 වියදම | 30 |
| | 6.3 රාජ්‍ය මූල්‍ය ශේෂයන් හා මූල්‍යකරණය | 32 |
| | 6.4 අවදානම් පිළිබඳ ප්‍රකාශය | 32 |

# පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024

## 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52(6)(අ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන ප්‍රකාශය

අනුර කුමාර දිසානායක වන මම, ජනාධිපති සහ මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා වශයෙන්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අංක 52 (8) වගන්තිය ප්‍රකාරව පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව සකස් කිරීම සඳහා මහා භාණ්ඩාගාර ලේකම් වෙත පැහැදිලි කළයුතු තොරතුරු පැහැදිලි කරමින් එම වගන්තිය යටතේ සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති බව මෙයින් ප්‍රකාශ කරමි.

අ/කළේ
**අනුර කුමාර දිසානායක**
ජනාධිපති, මුදල්, ආර්ථික සංවර්ධන,
ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා ලෙස,
2024 ඔක්තෝබර් 14 දින, කොළඹ දී ය.

# පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024

## 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52 (6) (ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන ප්‍රකාශය

භාණ්ඩාගාර ලේකම්, කනකරත්න මුදියන්සේලාගේ මහින්ද සිරිවර්ධන වන මම, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52 (6) (ආ) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති වගකීම අනුව, මෙම පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අඩංගු තොරතුරු හැකි උපරිමයෙන් පහත සඳහන් පරිදි ඉදිරිපත් කරන බව මෙයින් ප්‍රකාශ කරමි.

i. මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ප්‍රශස්ථ වෘත්තීමය නිගමනයන් පිළිබිඹු වන බවත්;

ii. මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයට ලබා ගත හැකි සියළුම ආර්ථික හා මූල්‍ය තොරතුරු සැලකිල්ලට ගත් බවත්; සහ

iii. එකී පනතේ 52(8) වගන්තිය ප්‍රකාරව මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා විසින් මා වෙත අනාවරණය කරන ලද රජය විසින් එළඹි තීරණයන් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණපෑමට සිදුවන රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් සහ එයට හේතු වූ කරුණු ද ඇතුලත් බවත්.

අ/කළේ
**කනකරත්න මුදියන්සේලාගේ මහින්ද සිරිවර්ධන**
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් සහ
මහා භාණ්ඩාගාරයේ ලේකම්
2024 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

# පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024

## 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52 වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලදී.

### 1. හැඳින්වීම

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා වන මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කිරීමේ ප්‍රකාශය හෝ නියෝගය ප්‍රකාශයට පත් කිරීමෙන් සති තුනක් ඇතුළත රටේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක් මහජනතාව වෙත ඉදිරිපත් කිරීමට මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් ක්‍රියා කළයුතු බවට විධිවිධාන දක්වා ඇති 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52 වැනි වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ[1].

ඒ අනුව, මෙම වාර්තාවේ රාජ්‍ය ආදායම එකතු කිරීම  සහ රාජ්‍ය වියදම් පිළිබඳ වන වගකීම් සඳහා අදාළ වන නෛතිකමය විධිවිධාන මත පදනම් වූ රජයේ ආදායම්, වියදම් සහ ණය ගැනීම් පිළිබඳ තාවකාලික සංඛ්‍යා දත්ත අඩංගු වේ. එමෙන්ම, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කරන ලද සමස්ත ආර්ථික තත්ත්වය පිළිබඳ අවබෝධ කර ගැනීම පහසු කිරීම  පිණිස 2024 වසරේ පළමු මාස අට තුළ සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් පිළිබඳව ද ඉදිරිපත් කරනු ලැබේ[2].

රටේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු වන පරිදි රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ඇස්තමේන්තු, අවදානම් සහ වෙනත් තොරතුරු සැකසීමේ දී භාවිතා කරනු ලබන ආර්ථික සහ අනෙකුත් උපකල්පන පිළිබඳ තොරතුරුවල පදනම ද මෙම වාර්තාවේ සඳහන් වේ.

---

1. ගරු ජනාධිපතිතුමන් විසින් 2024 සැප්තැම්බර් මස 24 දිනැති අංක 2403/13 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් 2024 සැප්තැම්බර් මස 24 වැනි දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ප්‍රකාශයට පත් කරන ලදී.

2. අදාළ බලධාරීන් විසින් 2023 වසර සඳහා වන  සංඛ්‍යාලේඛන රැස්කර ඇති අතර එමෙන්ම මෙම වාර්තාව 2024 අගෝස්තු මස අවසානයේ පවතින තාවකාලික සංඛ්‍යා දත්ත මත පදනම් වන අතර එම දත්ත සියලු ගිණුම් පියවූ විට විය හැකි වෙනස්කම්වලට යටත් වේ. කෙසේ වෙතත්, එවැනි වෙනස්කම් මෙම වාර්තාවේ සමස්ත අන්තර්ගතයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

## 2. සමාලෝචනය

2024 වසරේ පළමු භාගය තුළ දී සිදු වූ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, බදු ආදායම ඉහළ යාම, උද්ධමනය අඩු වීම සහ විදේශ විනිමය සංචිතවල වර්ධනය ආදිය හේතුකොට ගෙන ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ පත්වීමේ සළකුණු දක්නට ලැබුණි. 2024 වසරේ පළමු භාගය තුළ දී ආර්ථිකය සියයට 5.0 කින් වර්ධනය වූ අතර, 2024 වසරේ පළමු මාස අට තුළ ලද බදු ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 2,348.5 ක් දක්වා සියයට 41.4 කින් වර්ධනය විය. 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය සියයට 0.5 ක අවධමනයක් දක්වා පහත වැටුණු අතර, 2024 වසරේ අගෝස්තු මාසය අවසානයේ දී චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළුව දළ නිල සංචිත ඇ. ඩො. බිලියන 6.0 ක් දක්වා වර්ධනය විය.

2024 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට සමස්තයක් ලෙස සියයට 8.2 ක අතිප්‍රමාණයක් වාර්තා කරමින්, ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ, ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ප්‍රතිලාභ සලසමින් ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීමට උපකාරී විය. 2025 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි.ගෙන්) සියයට 2.3 ක් වන මධ්‍යකාලීන ප්‍රාථමික ශේෂ ඉලක්කය ළඟා කර ගැනීම පිණිස 2025 වසරේ දී සහ ඉන් ඔබ්බට රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා මූලික පදනම, සාර්ව ආර්ථික ස්ථායීතාවය පවත්වා ගැනීම සහ ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම තුළින් සැපයෙනු ඇත. කෙසේ වුවද, ඛනිජ තෙල් මිල ඉහළ යාමේ හැකියාව ද ඇතුළත්ව මෑත කාලීනව මැද පෙරදිග ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වයන් ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි අවදානම් තත්ත්වයන් ඇති කිරීමට ඉඩ ඇති අතර, එමඟින් උද්ධමනය ඉහළ යාම හා එහි ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාත මත ඇති විය හැකි බලපෑම් ආර්ථික ක්‍රියාකාරකම් අඩපණ කිරීමට ද හේතු විය හැකිය.

මෙම වාර්තාව සම්පාදනය කරන අවස්ථාව වන විට, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ දෙවන සමාලෝචනය සාර්ථකව සම්පූර්ණ කර තිබෙන අතර, එම වැඩසටහන ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා අඛණ්ඩව සහාය වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ සකස් කරන ලද ඉලක්ක ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය අංශය වඩාත් හිතකර තත්ත්වයක පවතියි. 2024 වසරේ පළමු භාගය තුළදී, ශ්‍රී ලංකාව ද. දේ. නි.යෙන් සියයට 3.7 ක ප්‍රාථමික ශේෂයක් සහ ද. දේ. නි.යෙන් සියයට 12.7 ක ප්‍රදාන ද ඇතුළත් රාජ්‍ය ආදායමක් වාර්තා කර ඇත. තවද, ශ්‍රී ලංකාව 2024 වසරේ පළමු කාර්තු දෙක තුළ බදු ආදායම සහ ප්‍රාථමික ශේෂය පිළිබඳ ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක ද ලඟා කර ගෙන ඇත.

ප්‍රදාන ද ඇතුළු රජයේ ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී පැවති රු. බිලියන 1,826.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,565.9 ක් දක්වා සියයට 40.5 කින් වර්ධනය විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 4,127.0 න් සියයට 62.2 ක් ළඟා කර ගැනීමකි.

රජයේ වියදම 2023 වසරේ පළමු මාස අට තුළ පැවති රු. බිලියන 3,297.3 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,476.9 ක් දක්වා සියයට 5.4 කින් වැඩි විය. බැංකු ප්‍රාග්ධනීකරණය සඳහා වෙන් කළ රු. බිලියන 450 ක් ද ඇතුළත් වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 6,978 න් සියයට 49.8 ක් දක්වා මෙම වියදම ළඟා වී ඇත. ඒ අනුව, අයවැය හිඟය 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 1,470.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 911.0 ක් දක්වා රු. බිලියන 559.7 කින් අඩු විය. 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 55.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 648.8 ක් දක්වා ප්‍රාථමික අතිරික්තය සැලකිය යුතු ලෙස වර්ධනය විය.

### 3. 2024 වසරේ ආර්ථික ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ ආර්ථිකය, 2023 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ සියයට 7.3 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 5.0 කින් වර්ධනය විය. ඉදිකිරීම්, පතල් හා කැණීම් හා නිෂ්පාදන කර්මාන්තයන්හි ප්‍රසාරණය හේතුවෙන් කර්මාන්ත අංශය 2024 වසරේ පළමු භාගයේ දී සියයට 11.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ප්‍රධාන වශයෙන් ධාන්‍ය වගාව, මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීව වගාව හා සත්ත්ව නිෂ්පාදන අංශයන්ගෙන් පිළිබිඹු වූ වර්ධනය හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේ දී කෘෂිකාර්මික අංශය සියයට 1.4 කින් වර්ධනය විය. නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවන් හා රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් යන ක්‍රියාකාරකම්වල ප්‍රසාරණය හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේ දී සේවා අංශය සියයට 2.6 කින් වර්ධනය විය.

ආහාර හා ආහාර නොවන කාණ්ඩයන් යන දෙවර්ගයේම අවධමනය හේතුවෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2015 වසරේ සැප්තැම්බර් මාසයට පසු ප්‍රථම වතාවට 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.5 ක අවධමනයක් වාර්තා කරන ලදී. මෑතකාලීනව විදුලි ගාස්තු, ඉන්ධන සහ එල් පී ගෑස් මිල ගණන් අඩු කිරීම සඳහා සිදු කරන ලද සංශෝධනයන් සහ සැපයුම් තත්ත්වයන් වැඩි දියුණුවීම හේතුවෙන් ආහාර මිල ගණන් පහත වැටීම, ප්‍රධාන වශයෙන් මෙම අවධමනයට තුඩු දී ඇත. මේ අතර, විරැකියා අනුපාතය 2023 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.5 දක්වා අඩු විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 වසරේ ජූනි මස සිට ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරන ලදී. 2023 වසරේ අගෝස්තු මස පිළිවෙළින් සියයට 11 ක් සහ සියයට 12 ක් ව පැවති නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, 2024 වසරේ අගෝස්තු මස වන විට පිළිවෙළින් සියයට 8.25 ක් සහ සියයට 9.25 ක් දක්වා පදනම් අංක 275 කින් පහළ දමන ලදී. 2023 වසරේ ජනවාරි මස සිට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන දින දර්ශිත මාසයක් තුල පස් වතාවකට පමණක් සීමා කරමින් පැනවූ වාරණය 2024 වසරේ අප්‍රේල් මාසයේ දී ඉවත් කරන ලදී.

දේශීය මුදල් වෙළෙඳපොළට අමතර ද්‍රවශීලතාවයක් සැපයීම සඳහා 2023 වසරේ අගෝස්තු මාසයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00 ක් දක්වා පදනම් අංක 200 කින් අඩු කරන ලදී. ඒ

අනුව, 2022 වසර තුළ දී, සාමාන්‍යයක් ලෙස රු. බිලියන 450 ක පමණ හිඟ මට්ටමක පැවති දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය, 2023 වසරේ දී සාමාන්‍යයක් ලෙස රු. බිලියන 70 ක පමණ හිඟ ද්‍රවශීලතා මට්ටමක් දක්වා වැඩිදියුණු විය.

2023 වසරේ අගෝස්තු මස රු. බිලියන 12,697.9 ක්ව පැවති ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම 2024 වසරේ අගෝස්තු මස වන විට රු. බිලියන 13,876.8 ක් විය. මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොග අඩු කිරීමත් සමඟ රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2023 වසරේ අගෝස්තු මස පැවති රු. බිලියන 8,465.3 සිට 2024 වසරේ අගෝස්තු මාසයේ දී රු. බිලියන 8,152.6 ක් දක්වා සියයට 4.8 කින් අඩු විය.

සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) (ASPI) 2023 වසරේ අගෝස්තු මස අවසානයේ දී පැවති 11,114.17 ක අගයක සිට 2024 වසර අගෝස්තු මස අවසන් වන විට 10,869.07 ක් දක්වා සියයට 2.2 කින් සංකෝචනය විය. ඊට අමතරව, ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය (S&P SL20) 2023 වසරේ අගෝස්තු මස අවසානයේ දී පැවති 3,131.07 ක අගයක සිට 2024 වසර අගෝස්තු මස අවසන් වන විට 3,058.60 ක් දක්වා සියයට 2.3 කින් අඩු විය. වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය ද 2023 වසරේ අගෝස්තු මස අවසානයේ දී පැවති රු. බිලියන 4,441.26 ක අගයක සිට 2024 වසරේ අගෝස්තු මස අවසන් වන විට රු. බිලියන 4,320.98 ක් දක්වා සියයට 2.7 කින් අඩු විය. 2024 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට මුළු විදේශීය මිල දී ගැනීම් රු. මිලියන 41,735.5 ක් වූ අතර මුළු විදේශීය විකුණුම් රු. මිලියන 35,926.1 ක් විය.

විදේශ අංශය 2024 වසරේ පළමු මාස අට තුළ අපනයන ආදායම ඉහළ යාමත්, සංචාරක අංශයේ සහ සේවකයින්ගේ ප්‍රේෂණවලින් ලැබීම් ඉහළ යාමත් සමඟ සමස්ත ගෙවුම් ශේෂයේ ඇ. ඩො. මිලියන 2,184.4 ක අතිරික්තයක් වාර්තා කරමින් ධනාත්මක ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. අපනයන ආදායම ඇ. ඩො. මිලියන 8,499.1 දක්වා සියයට 6.1 කින් වැඩි වූ අතර ආනයන වියදම ද ඇ. ඩො. මිලියන 12,072.5 දක්වා සියයට 10.0 කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය 2023 වසරේ පළමු මාස අට තුළ වූ ඇ. ඩො. මිලියන 2,964.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 3,573.4 දක්වා පුළුල් විය.

සංචාරක ක්ෂේත්‍රයේ පුනරුදයත් සමඟ සංචාරකයින්ගේ පැමිණීම පුද්ගලයින් 1,362,668 ක් දක්වා සියයට 50.7 කින් වැඩි වීම හේතුවෙන් සංචාරක ඉපැයීම් 2023 වසරේ පළමු මාස අට තුළ වූ ඇ. ඩො. මිලියන 1,304.5 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 2,167.0 දක්වා වැඩි විය. විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ ලැබීම හේතුවෙන් සහ විදේශ රැකියා සඳහා පිටත්වීම් පුද්ගලයින් 205,929 දක්වා සියයට 4.0 කින් වැඩි වීමත් සමඟ විදේශ ශ්‍රමික ප්‍රේෂණ 2023 වසරේ පළමු මාස අට තුළ වූ ඇ. ඩො. මිලියන 3,862.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 4,288.2 දක්වා සියයට 11.0 කින් වැඩි විය. මේ අතර, චීනයේ මහජන බැංකුවේ විදේශ හුවමාරු පහසුකම ද ඇතුළුව දළ නිල සංචිතය, 2023 වසරේ අගෝස්තු මස අවසානය වන විට වූ ඇ.ඩො. බිලියන 3.6 සිට 2024 වසරේ අගෝස්තු මස අවසානය වන විට ඇ.ඩො. බිලියන 6.0 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.

ක්‍රියාත්මක කරන ලද වඩාත් යෝග්‍ය රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ විදේශ අංශය ධනාත්මක ප්‍රතිඵල පිළිබිඹු කරමින් 2024 වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 8.2 කින් අතිප්‍රමාණය විය. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි, 2023 වසරේ පළමු මාස අට තුළ වූ

ඇ.ඩො. මිලියන 15.4 ක ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 44.4 දක්වා ශුද්ධ ලැබීම්වල වැඩිවීමක් වාර්තා කළේය.

2024 වසරේ පළමු මාස අට තුළ කාර්මික අපනයන ඉපැයීම් ඇ. ඩො. මිලියන 6,658.6 දක්වා සියයට 6.1 කින් ද, කෘෂිකාර්මික අපනයන ඉපැයීම් ඇ. ඩො. මිලියන 1,804.0 දක්වා සියයට 5.9 කින් ද, ඛනිජ අපනයන ඉපැයීම් ඇ. ඩො. මිලියන 18.8 දක්වා සියයට 19.8 කින් ද වැඩි විය. රෙදිපිළි හා ඇඟලුම්, තේ, ඛනිජ තෙල් නිෂ්පාදන සහ රබර් නිෂ්පාදනවලින් අපනයන ආදායම ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

2024 වසරේ පළමු මාස අට තුළ පාරිභෝගික භාණ්ඩ, අතරමැදි භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා ආනයන වියදම් පිළිවෙළින් ඇ.ඩො. මිලියන 2,176.3 දක්වා සියයට 7.3 කින් ද, ඇ.ඩො. මිලියන 7,750.0 දක්වා සියයට 7.9 කින් ද, ඇ.ඩො. මිලියන 2,140.3 දක්වා සියයට 22.5 කින් ද වැඩි විය. ගෝලීය වෙළෙඳපොළෙහි භාණ්ඩ මිල ගණන් ඉහළ යාමේ බලපෑමත්, ආර්ථික ක්‍රියාකාරකම්වල පුනර්ජීවනය සහ ආනයන සීමාකිරීම් ඉවත් කිරීමත් සමග ප්‍රධාන වශයෙන් පිරිපහදු කළ ඛනිජතෙල්, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සහ ආහාර පාන ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් සමස්ත ආනයන වියදම ඉහළ යන ලදී.

වගුව 1 : විදේශ වෙළෙඳාම

ඇ.ඩො. මිලියන

| වර්ගීකරණය | 2022 | 2023 | 2023<br>ජන - අගෝ. | 2024<br>ජන - අගෝ. |
|---|---|---|---|---|
| **අපනයන** | **13,106.4** | **11,910.7** | **8,010.1** | **8,499.1** |
| **කෘෂි නිෂ්පාදන** | **2,568.0** | **2,566.5** | **1,702.9** | **1,804.0** |
| තේ | 1,258.8 | 1,309.9 | 870.4 | 942.3 |
| අනෙකුත් කෘෂි අපනයන | 1,309.2 | 1,256.6 | 832.5 | 861.7 |
| **කාර්මික නිෂ්පාදන** | **10,465.3** | **9,277.7** | **6,273.6** | **6,658.6** |
| රෙදිපිළි හා ඇඟළුම් | 5,952.0 | 4,878.9 | 3,325.7 | 3,364.8 |
| රබර් නිෂ්පාදන | 977.0 | 902.2 | 588.1 | 663.1 |
| යන්ත්‍ර සහ උපකරණ | 580.9 | 598.2 | 418.7 | 336.1 |
| මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ | 450.6 | 500.0 | 353.0 | 282.1 |
| ආහාරපාන සහ දුම්කොළ | 519.5 | 539.3 | 354.4 | 427.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 568.0 | 539.4 | 325.7 | 702.5 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 1,417.3 | 1,319.7 | 908.0 | 882.8 |
| **ඛනිජ** | **50.0** | **38.5** | **15.7** | **18.8** |
| **වෙනත්** | **23.2** | **28.0** | **17.9** | **17.7** |
| **ආනයන** | **18,291.0** | **16,811.0** | **10,974.1** | **12,072.5** |
| **පාරිභෝගික භාණ්ඩ** | **2,813.0** | **3,043.9** | **2,028.3** | **2,176.3** |
| ආහාර හා පාන වර්ග | 1,607.9 | 1,693.0 | 1,158.0 | 1,214.1 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1,205.1 | 1,350.9 | 870.3 | 962.2 |
| **අන්තර් භාණ්ඩ** | **12,438.8** | **11,006.6** | **7,185.5** | **7,750.0** |
| ඛනිජ තෙල් | 4,896.8 | 4,702.6 | 3,079.5 | 2,896.5 |
| පොහොර | 275.9 | 235.0 | 139.8 | 102.9 |
| රෙදි පිළි හා ඇඟළුම් | 3,065.2 | 2,371.2 | 1,584.0 | 1,839.3 |
| තිරිඟු සහ ඉරිඟු | 303.1 | 338.2 | 201.9 | 204.5 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 4,174.0 | 3,359.6 | 2,180.3 | 2,706.8 |
| **ආයෝජන භාණ්ඩ** | **3,030.4** | **2,744.6** | **1,747.9** | **2,140.3** |
| යන්ත්‍ර සහ උපකරණ | 1,969.0 | 1,867.6 | 1,219.0 | 1,438.6 |
| ප්‍රවාහන උපකරණ | 132.1 | 98.5 | 45.6 | 98 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 926.3 | 775.1 | 481.4 | 601.9 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 3.0 | 3.3 | 1.9 | 1.8 |
| **වෙනත්** | **8.8** | **16.0** | **12.4** | **5.9** |
| **වෙළෙඳ ශේෂය** | **-5,184.6** | **-4,900.3** | **-2,964.0** | **-3,573.4** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## 4. රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් 2024

2024 වසරේ පළමු මාස අට තුළ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සැළකිය යුතු ලෙස වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන්ම 2024 වසර තුළ දී රාජ්‍ය මූල්‍ය අංශයෙහි ප්‍රාථමික අතිරික්තයක් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගනිමින් ක්‍රියාවට නංවන ලද ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ඉවහල් විය. ප්‍රදාන ද ඇතුළුව රජයේ ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 1,826.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 40.5 කින් එනම් රු. බිලියන 739.3 කින් වර්ධනය විය. කෙසේ වුවද, 2024 වසරේ මෙම කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය වියදම රු. බිලියන 3,476.9 දක්වා සියයට 5.4 කින් ඉහළ යන ලදී. ඒ අනුව, 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 55 ක ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 648.8 ක ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා විය. සමස්ත අයවැය හිඟය 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 1,470.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 38.1 කින් එනම් රු. බිලියන 559.7 කින් රු. බිලියන 911.0 දක්වා අඩු විය. ජංගම ගිණුමේ හිඟය 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 1,121.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 56.9 කින් එනම් රු. බිලියන 637.9 කින් රු. බිලියන 483.8 දක්වා අඩු විය. ශුද්ධ දේශීය මූල්‍යකරණය 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 1,376.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 742.4 දක්වා සියයට 46.1 කින් අඩු වූ අතර ශුද්ධ විදේශීය මූල්‍යකරණය 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 93.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 168.6 දක්වා සියයට 79.7 කින් වැඩි විය. 2024 වසරේ පළමු භාගය තුළ නොපිය වූ සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 38.5 ක් විදේශීය ණය ද සියයට 61.5 ක් දේශීය ණය ද වූ අතර 2023 වසරේ ජුනි මස අවසාන වනවිට පැවැති රු. බිලියන 26,916.2 ක් වූ නොපියවන ලද සමස්ත ණය ප්‍රමාණය 2024 වසරේ ජුනි මස අවසාන වනවිට රු. බිලියන 28,563.5 දක්වා සියයට 6.1 කින් වැඩි විය.

බදු ආදායම, බදු නොවන ආදායම සහ ප්‍රදාන ඇතුළත් සමස්ත රාජ්‍ය ආදායම, 2024 වසරේ පළමු මාස අට තුළ දී වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 4,127.0 න් සියයට 62.2 ක් ලඟා කර ගන්නා ලදී. ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට පත් වීම, ඉහළ බදු අනුකූලතා අනුපාතයන්ට හේතු වූ බදු පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග, බදු පදනම පුළුල් කිරීම සහ බදු අනුපාත ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, රාජ්‍ය ආදායමේ මෙම කැපී පෙනෙන කාර්යසාධනයට හේතු විය. බදු ආදායම 2024 වසරේ එහි වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 3,820 න් සියයට 61.5 ක් ලඟා කර ගනිමින් 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 1,661.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,348.5 දක්වා සියයට 41.4 කින් වර්ධනය විය.

ආදායම් බදු මඟින් ලද ආදායම එහි වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 1,080.0 න් සියයට 57.8 ක් ලඟා කර ගනිමින්, 2024 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 624.7 දක්වා සියයට 16.3 කින් වර්ධනය විය. මෙලෙස ආදායම් බද්දෙන් ලද ආදායම වර්ධනය වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2024 වසරේ පළමු මාස අට තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) සහ රඳවා තබා ගැනීමේ බද්ද (WHT) මඟින් ලද ආදායම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද ආදායමට සාපේක්ෂව ඉහළ යාමයි. 2024 වසරේ පළමු මාස අට තුළ භාණ්ඩ හා සේවා මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 1,421.3 ක් දක්වා සියයට 59.8

කින් වර්ධනය විය. එකතු කල අගය මත බදු නිදහස් කිරීම්වලින් බොහොමයක් ඉවත් කිරීම, එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම සහ එකතු කළ අගය මත බදු අනුපාත ඉහළ නැංවීම හේතුවෙන් 2023 වසරේ එකතු කල අගය මත බද්දෙන් ලද සමස්ත ආදායම රු. බිලියන 148 කින් ඉක්මවා යමින්, 2024 වසරේ පළමු මාස අට තුළ දී එකතු කල අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 842.5 ක් දක්වා සියයට 87.2 කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. ඛනිජ තෙල් නිෂ්පාදන මත වන නිෂ්පාදන බද්ද, මත්පැන් මත සුරා බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මඟින් ලද ආදායම ඉහළ යාම ද මෙම වර්ධනය සඳහා ඉවහල් විය.

ආනයන සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීමෙන් පැන නැඟි ආනයන ඉහළ යාම හේතුවෙන් විදේශ වෙළෙඳාම මත බදු මඟින් ලද ආදායම, 2023 වසරේ පළමු මාස අට තුළ ලද ආදායමේ සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 302.5 දක්වා සියයට 29 කින් වර්ධනය විය. සෙස් බද්ද සහ රේගු ආනයන බදු මඟින් ලද ආදායම ඉහළ යාම සහ සීනි සහ අර්තාපල් වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත ඉහළ නැංවීම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම රු. බිලියන 67.2 දක්වා සියයට 110.1 කින් වැඩිවීම සහ රේගු ආනයන බදු සහ සෙස් බද්දෙන් ලද ආදායම ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. තෝරාගත් භාණ්ඩ සඳහා වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ඉවත් කර තිබියදීත්, වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද මඟින් ලද ආදායම ද සියයට 3.4 කින් සුළු වශයෙන් වර්ධනය විය.

බදු නොවන ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 158.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 209.3 දක්වා සියයට 31.7 කින් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ දඩ, ගාස්තු හා අයකිරීම් සහ පොලී ආදායමෙන් ලද ආදායම වර්ධනය වීමයි.

සමස්ත රාජ්‍ය වියදම 2024 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 3,476.9 දක්වා සියයට 5.4 කින් සුළු වශයෙන් වැඩි විය. 2024 වසරේ පළමු මාස අට තුළ සමස්ත රාජ්‍ය වියදමෙන් සියයට 87.5 ක් පමණ වූ පුනරාවර්තන වියදම්, 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 2,941.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,041.6 දක්වා සියයට 3.4 කින් සුළු වශයෙන් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම හේතුවෙන් වැටුප් හා වේතන 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 618.1 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 659.5 දක්වා සියයට 6.7 කින් වර්ධනය වීම සහ දේශීය හා විදේශීය ණය මත පොලී ගෙවීම් වැඩි වීම හේතුවෙන් පොලී ගෙවීම් 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 1,525.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,559.7 දක්වා සියයට 2.2 කින් වර්ධනය වීමය. 2024 වසරේ පළමු මාස අට තුළ සහනාධාර සහ පැවරුම් රු. බිලියන 623.8 දක්වා සියයට 1.5 කින් සුළු වශයෙන් වර්ධනය විය. මේ අතර, ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 355.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 435.3 දක්වා සියයට 22.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

වගුව 2 : රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්හි සාරාංශය - 2024 ජනවාරි සිට අගෝස්තු දක්වා

රු. මිලියන

| අයිතමය | 2023 (ජන.-අගෝ.) | 2024 ඇස්තමේන්තුව | 2024 (ජන.-අගෝ.) |
|---|---|---|---|
| ආදායම් හා ප්‍රදාන | **1,826,623** | **4,127,000** | **2,565,921** |
| ආදායම | **1,819,990** | **4,107,000** | **2,557,792** |
| බදු ආදායම | 1,661,152 | 3,820,000 | 2,348,529 |
| බදු නොවන ආදායම | 158,838 | 287,000 | 209,263 |
| ප්‍රදාන | 6,633 | 20,000 | 8,129 |
| වියදම | **3,297,278** | **6,977,783** | **3,476,885** |
| පුනරාවර්තන | **2,941,675** | **5,277,008** | **3,041,565** |
| වැටුප් හා වේතන | 618,066 | 1,126,885 | 659,502 |
| පොළී ගෙවීම් | 1,525,673 | 2,650,989 | 1,559,721 |
| සහනාධාර හා මාරු කිරීම් | 614,417 | 1,157,952 | 623,779 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 183,519 | 341,182 | 198,563 |
| ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම් | **355,603** | **1,700,775** | **435,320** |
| රාජ්‍ය ආයෝජන | 389,634 | 1,709,775 | 454,744 |
| අනෙකුත් | (34,031) | (9,000) | (19,424) |
| ආදායම් හිඟය (-) /අතිරික්තය (+) | **(1,121,685)** | **(1,170,008)** | **(483,773)** |
| සමස්ත අයවැය හිඟය (-) /අතිරික්තය (+) | **(1,470,655)** | **(2,850,783)** | **(910,965)** |
| මූල්‍යයනය | **1,470,655** | **2,850,783** | **910,965** |
| විදේශය මූල්‍යයනය (ශුද්ධ) | 93,806 | 726,000 | 168,551 |
| දේශය මූල්‍යයනය (ශුද්ධ) | 1,376,849 | 2,124,783 | 742,414 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### 4.1 රාජ්‍ය ආදායම

ප්‍රදාන ද ඇතුළුව රජයේ ආදායම, 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 1,826.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 40.5 කින් එනම් රු. බිලියන 739.3 කින් වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන්ම, බදු ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 1,661.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,348.5 වර්ධනය වීම හේතු විය. සමස්ත බදු ආදායමෙන් සියයට 60.5 ක් වන භාණ්ඩ හා සේවා මත බද්දෙන් ලද ආදායම සියයට 59.8 කින් එනම් රු. බිලියන 531.9 කින් 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 889.5 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,421.3 ක් දක්වා වර්ධනය විය. මෙම වර්ධනය සඳහා බොහෝ දුරට හේතු වූයේ එකතු කළ අගය මත බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 450 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 842.5 දක්වා සියයට 87.2 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වීමය. මේ අනුව, 2024 වසරේ පළමු මාස අට තුළ දී එකතු කල අගය

මත බද්දෙන් ලද ආදායම ඉහළ කාර්යසාධනයක් පෙන් වූ අතර එම ආදායම 2023 සමස්ත වසර තුළ දී ම එකතු කල අගය මත බද්දෙන් ලද ආදායම වන රු. බිලියන 694.5 ඉක්මවා යන ලදී. කෙසේ වුවද, බදු අනුකූලතාව, බදු ආදායම් අහිමි වීම ඉවත් කිරීම, ඩිජිටල්කරණය සහ ශක්තිමත් බදු පරිපාලනය ඔස්සේ දූෂණ අවදානම් අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම් උත්පාදනය සම්බන්ධයෙන් අත්කරගත් ප්‍රගතිය මධ්‍ය කාලීනව තිරසර ලෙස පවත්වා ගනිමින් වැඩිදියුණු කළ යුතුය.

**වගුව 3 : රාජ්‍ය ආදායමේ සාරාංශය 2024 ජනවාරි සිට අගෝස්තු දක්වා**

රු. මිලියන

| අයිතමය | 2023 (ජන.- අගෝ.) | 2024 ඇස්තමේන්තුව | 2024 (ජන.-අගෝ.) |
|---|---|---|---|
| **බදු ආදායම** | **1,661,152** | **3,820,000** | **2,348,529** |
| ආදායම් බදු | 537,175 | 1,080,000 | 624,670 |
| භාණ්ඩ හා සේවා මත බදු | 889,460 | 2,235,000 | 1,421,342 |
| එකතු කළ අගය මත බදු | 449,981 | 1,400,000 | 842,487 |
| නිෂ්පාදන බදු | 271,675 | 545,000 | 385,740 |
| අනෙකුත් බදු හා ගාස්තු | 167,804 | 290,000 | 193,114 |
| විදේශ වෙළඳාම මත බදු | 234,518 | 505,000 | 302,517 |
| **බදු නොවන ආදායම** | **158,838** | **287,000** | **209,263** |
| **මුළු ආදායම** | **1,819,990** | **4,107,000** | **2,557,792** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### 4.1.1 බදු ආදායම

#### ආදායම් බදු

ආදායම් බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී ලද රු. බිලියන 537.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 624.7 දක්වා සියයට 16.3 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පසුගිය වසරවල දී ක්‍රියාත්මක වූ බදු ප්‍රතිපත්ති වෙනස්වීම් මගින් පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු (CIT), අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) සහ රඳවා ගැනීමේ බද්ද (WHT) මත ඇති වූ බලපෑම මෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත තනි පුද්ගල බදු ගෙවන්නන්ගේ ගනුදෙනු පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට මූල්‍ය ආයතනවලට අනිවාර්ය කිරීම, තනි පුද්ගල ආදායම් බදු ගෙවන්නන් සඳහා ඉලෙක්ට්‍රොනික ක්‍රමයට බදු ගොනු කිරීම අනිවාර්ය කිරීම, බදු අරමුණු සඳහා වියදම් ලෙස අඩු කිරීමට ඉඩ නොදීම සහ රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නිරන්තර තොරතුරු හුවමාරු කර ගැනීම තහවුරු කිරීමට අදාලව විධිමත් රෙගුලාසි නිකුත් කිරීම වැනි ශක්තිමත් බදු පරිපාලන ක්‍රියාමාර්ගයන් වෙත යොමුවීමේ බලපෑමය. පුද්ගල සහ සංස්ථාපිත බදු ආදායම ද 2023 වසරේ පළමු මාස අට තුළ

ලද ආදායමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 16.3 කින් වර්ධනය විය. එසේම, 2023 වසරේ පළමු මාස අට තුළ රුපියල් බිලියන 23.9 ක් වූ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම 2024 සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 31.7 දක්වා සියයට 32.6 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. තවද, පොළී ආදායම මත වන රඳවා ගැනීමේ බදු ආදායම ද රු. බිලියන 97.8 සිට රු. බිලියන 113.4 දක්වා සියයට 16.0 කින් වර්ධනය විය.

### එකතු කළ අගය මත බද්ද (වැට් බද්ද)

සමස්ත බදු ආදායමෙන් සියයට 35.9 ක් සඳහා දායකත්වය දක්වන එකතු කළ අගය මත බද්ද 2024 වසරේ පළමු මාස අට තුල බදු ආදායම සඳහා විශාලතම දායකත්වය ලබා දී ඇත. ප්‍රධාන වශයෙන්, 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව අඩු කිරීම, එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් බහුතරයක් ඉවත් කිරීම සහ ආනයන සීමා ඉවත් කිරීමේ බලපෑම හේතුවෙන් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, 2023 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 450.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 842.5 දක්වා සියයට 87.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, 2023 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 312.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 468.8 දක්වා සියයට 49.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ආනයනය මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 137.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 373.7 දක්වා සියයට 172.7 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. කෙසේ වෙතත්, 2024 වසරේ පළමු මාස අට තුළ එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 60.2 ක් පමණක් ලඟා කර ගෙන ඇත.

### නිෂ්පාදන බදු

ප්‍රධාන වශයෙන් ඛණිජ තෙල්, මත්පැන්, මෝටර් වාහන සහ අනෙකුත් නිෂ්පාදන බදු අයකළ හැකි අයිතමයන්ගෙන් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් දුම්වැටි මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායමේ අඩුවීමක් තිබුණ ද නිෂ්පාදන බදුවලින් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී උපයන ලද රු. බිලියන 271.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 385.7 ක් දක්වා සියයට 42.0 කින් ඉහළ ගියේය. නිෂ්පාදන බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 70.8 ක් ලඟා කරගනිමින් බදු ආදායමෙන් සියයට 16.4 ට සහ සමස්ත ආදායමෙන් සියයට 15.1 ට දායක විය.

2023 වසරේ ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්ධන ලීටරයක් මත රු. 25 ක නිෂ්පාදන බද්දක් පැනවීම සහ 2024 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට ඩීසල් ලීටරයක් මත පනවා තිබූ නිෂ්පාදන බද්ද රු. 6 කින් සහ පෙට්‍රල් ලීටරයක් මත පනවා තිබූ නිෂ්පාදන බද්ද රු. 5 කින් අඩු කිරීම හේතුවෙන් ඉන්ධන සඳහා වූ නිෂ්පාදන බද්දේ ශුද්ධ වැඩිවීම මත හා ඉන්ධන කෝටා ක්‍රමය ඉවත් වීමත් සමඟ ආනයන වැඩිවීම හා 2024 වසරේ පළමු කාර්තුවේ වාර්තා කළ ආර්ථික වර්ධනයත් සමග ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් ඛණිජතෙල් මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා කළ රු. බිලියන 58.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 139.3 ක් දක්වා සියයට 137.4 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය.

මත්පැන් මත සුරාබද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 108.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 133. ක් දක්වා සියයට 22.8 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බදු අනුපාත සියයට 14 කින් වැඩි කිරීමය. කෙසේ වෙතත්, සමස්ත මත්පැන් නිෂ්පාදනය 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ නිරපේක්ෂ ලීටර් මිලියන 22.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී නිරපේක්ෂ ලීටර් මිලියන 21.4 දක්වා සියයට 5.4 කින් අඩු විය. දේශීයව නිෂ්පාදනය කරන ලද සැර මත්පැන් මත නිෂ්පාදන බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 71.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 83.6 දක්වා සියයට 17.8 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස අට තුළ මත්පැන් මත සුරාබද්ද මඟින් ලද ආදායම ඇස්තමේන්තුගත මුළු ආදායමෙන් සියයට 58.1 කි.

විදෙස්ගත ශ්‍රමිකයින්ට විද්‍යුත් මෝටර් රථ ආනයනය කිරීමට ඉඩ සැලැස්වීම සඳහා ක්‍රමවේදයක් සැකසීම වැනි වාහන ආනයනය සඳහා පනවා තිබූ සීමා යම් තරමකට ලිහිල් කිරීම හේතුවෙන් මෝටර් වාහන මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 21.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 36.5 ක් දක්වා සියයට 74.3 කින් වර්ධනය විය

තවද, ආනයන සීමාවන් ලිහිල් කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් මේද අම්ල සහිත නිෂ්පාදන, සීනි සහ සීනි ආශ්‍රිත රසකැවිලි නිෂ්පාදන, සිමෙන්ති, යාන්ත්‍රික උපකරණ සහ බදු අයකළ හැකි අනෙකුත් අයිතමයන්ගෙන් උපයාගත් නිෂ්පාදන බදු ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා කළ රු. බිලියන 2.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 4.7 දක්වා සියයට 59.1 කින් වර්ධනය විය.

කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය අනුව දුම්වැටිවල මිල ගැලපීම සඳහා සියළුම දුම්වැටි වර්ගවලට අදාළ නිෂ්පාදන බද්ද 2024 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 14 කින් ඉහළ දැමුව ද දුම්වැටිවල අළෙවිය දුම්වැටි මිලියන 1,228 දක්වා සියයට 21.8 කින් පහළ යාම හේතුවෙන් දුම්වැටි මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 80.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 71.6 දක්වා සියයට 10.8 කින් පහළ ගොස් ඇත.

### විදේශ වෙළෙඳාම මත පනවන ලද බදු

රේගු ආනයන බද්ද, සෙස් බද්ද, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වැනි විදේශ වෙළෙඳාම මත පනවන ලද බදුවලින් උපයාගත් ආදායම, 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 234.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 302.5 ක් දක්වා සියයට 29 කින් වර්ධනය විය.

රේගු ආනයන බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 57.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 69.4 ක් දක්වා සියයට 20.5 කින් සැළකිය යුතු ලෙස වර්ධනය වූ අතර, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම සහ රේගු ආනයන බදු අනුපාත ඉහළ නැංවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය.

සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 34.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 52.0 ක් දක්වා සියයට 49.6 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, ඇතැම් ආනයන සීමා ලිහිල් කිරීම් මේ සඳහා හේතුවිය. ඒ අනුව, ආනයන මත පනවන ලද සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 32.2 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 50.5 ක් දක්වා සියයට 52.2 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මේ අතර, අපනයන මත පනවන ලද සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 1.5 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1.4 ක් දක්වා සියයට 7.5 කින් සුළු වශයෙන් අඩු විය. 2024 වසරේ පළමු මාස අට තුළ දී උපයන ලද සෙස් බදු ආදායම, 2024 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 60.0 න් සියයට 86.6 ක් නියෝජනය කරයි.

2023 වසරේ අප්‍රේල් මාසයේ දී අයිතම 1,631 ක් සහ 2024 වසරේ ජනවාරි මාසයේ දී අයිතම 26 ක් ක්‍රමානුකූලව ඉවත් කළ නමුදු, ආනයන සීමා ලිහිල් කිරීම හේතුවෙන්, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 110.2 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 113.9 ක් දක්වා සියයට 3.4 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස අට තුළ දී උපයන ලද වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු ආදායම, 2024 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 175 න් සියයට 65.1 ක් නියෝජනය කරයි.

විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් උපයන ලද ආදායම රු. බිලියන 67.2 ක් දක්වා සියයට 110.1 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම, සහ සීනි සහ අර්තාපල් සඳහා බද්ද ඉහළ නැංවීම මෙයට හේතුවිය.

#### 4.1.2 බදු නොවන ආදායම

බදු නොවන ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ තුළ වූ රු. බිලියන 158.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 209.3 දක්වා සියයට 31.7 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. දඩ, ගාස්තු සහ අයකිරීම්වලින් ආදායම් එකතු කිරීම 2023 වසරේ පළමු මාස අට තුළ ලද රු. බිලියන 77.2 සිට 2024 වසරේ සමාන කාලපරිඡ්ඡේදය තුළ දී රු. බිලියන 102.8 දක්වා සියයට 33.3 කින් වැඩිවීම මෙයින් පිළිබිඹු වේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරන ලද ගාස්තු සහ අය කිරීම් වැඩි කිරීම මෙයට හේතු විය. මේ අතර, පොලී ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 11.4 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 34.5 දක්වා සියයට 203.5 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද ලාභ සහ ලාභාංශ ලැබීම් ද 2023 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 22.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 26.8 දක්වා සියයට 20.6 කින් වැඩි විය. සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලැබෙන ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ ලද රු. බිලියන 23.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 27.7 දක්වා සියයට 16.6 කින් වැඩි විය. මේ අතර, කුලී ආදායමෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 3.9 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3.3 දක්වා සියයට 13.7 කින් අඩු විය. 2024 වසරේ පළමු මාස අට තුළ ලද බදු නොවන ආදායම ඇස්තමේන්තුගත වාර්ෂික බදු නොවන ආදායම වූ රු. බිලියන 287.0 න් සියයට 72.9 ක ළඟා කර ගැනීමකි.

### 4.2 රජයේ වියදම්

2024 වසරේ පළමු මාස අට තුළ රජයේ මුළු වියදම, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මුළු වියදම වූ රු. බිලියන 3,297.3 සිට රු. බිලියන 3,476.9 දක්වා සියයට 5.4 කින් ඉහළ ගොස් ඇත. මෙය රු. බිලියන 6,977.8 ක් වූ වියදම් ඇස්තමේන්තුවෙන් සියයට 49.8 ක ප්‍රමාණයකි. 2024 වසරේ පළමු මාස අට තුළ පුනරාවර්තන වියදම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 2,941.7 සිට රු. බිලියන 3,041.6 දක්වා සියයට 3.4 කින් මධ්‍යස්ථ ලෙස ඉහළ ගොස් ඇත. වැටුප් හා වේතන රු. බිලියන 618.1 සිට රු. බිලියන 659.5 ක් දක්වා රු. බිලියන 41.4 කින් එනම් සියයට 6.7 කින්, පොළී වියදම රු. බිලියන 1,525.7 සිට රු. බිලියන 1,559.7 ක් දක්වා රු. බිලියන 34.0 කින් එනම් සියයට 2.2 කින්, භාණ්ඩ හා සේවා රු. බිලියන 183.5 සිට රු. බිලියන 198.6 ක් දක්වා රු. බිලියන 15.0 කින් එනම් සියයට 8.2 කින්, හා සහනාධාර හා පැවරුම් රු. බිලියන 614.4 සිට රු. බිලියන 623.8 ක් දක්වා රු. බිලියන 9.4 කින් එනම් සියයට 1.5 කින් ආදී වශයෙන් පුනරාවර්තන වියදම් කාණ්ඩ හතරෙහිම මධ්‍යස්ථ වැඩිවීම් වාර්තා විය.

2024 වසරේ පළමු මාස අට තුළ දී මූලධන වියදම් හා ශුද්ධ ණය දීම් 2023 වසරේ පළමු මාස අට තුළ දී  වූ රු. බිලියන 355.6 සිට රු. බිලියන 435.3 දක්වා සියයට 22.4 කින් ඉහළ ගොස් ඇත. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සියයට 36.1 කින් හා රාජ්‍ය ආයතනවලට ණය දීම සියයට 74.8 කින් ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ආයෝජන රු. බිලියන 389.6 සිට රු. බිලියන 454.7 දක්වා සියයට 16.7 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ණය  ආපසු ගෙවීමේ බලපෑම හේතුවෙන් අනෙකුත් ආයෝජන සියයට 42.9 කින් පහළ ගොස් ඇත.

වගුව **4 :** රාජ්‍ය වියදම් - ආර්ථික වර්ගීකරණයට අනුව

රු. මිලියන

| අයිතමය | 2023 (ජන.- අගෝ.) | 2024 ඇස්තමේන්තුව | 2024 (ජන.-අගෝ.) |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **2,941,675** | **5,277,008** | **3,041,565** |
| වැටුප් හා වේතන | 618,066 | 1,126,885 | 659,502 |
| භාණ්ඩ හා සේවා | 183,519 | 341,182 | 198,563 |
| පොළී ගෙවීම් | 1,525,673 | 2,650,989 | 1,559,721 |
| සහනාධාර හා මාරු කිරීම් | 614,417 | 1,157,952 | 623,779 |
| **ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම්** | **355,603** | **1,700,775** | **435,320** |
| රාජ්‍ය ආයෝජන | 389,634 | 1,709,775 | 454,744 |
| අනෙකුත් | (34,031) | (9,000) | (19,424) |
| **මුළු වියදම** | **3,297,278** | **6,977,783** | **3,476,885** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා වියදම්

2024 වසරේ පළමු මාස අට තුළ ආරක්ෂක හමුදා, පොලිසිය සහ පළාත් සභාවලට අනුයුක්ත සේවකයින්ගේ වැටුප් ද ඇතුළත්ව රාජ්‍ය සේවකයින් සඳහා වැටුප් හා වේතන වියදම, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වියදම වූ රු. බිලියන 618.1 සිට රු. බිලියන 659.5 දක්වා සියයට 6.7 කින් ඉහළ ගොස් ඇත. ප්‍රධාන වශයෙන් වැටුප් වියදම් වැඩිවීම සිදුවූයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2024 සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව 2024 වසරේ ජනවාරි මස සිට මසකට රු. 5,000 කින් ජීවන වියදම් දීමනාව ඉහළ නැංවීම සහ 2024 අප්‍රේල් මස සිට එම දීමනාව තවත් රු. 5,000 කින් ඉහළ නැංවීම හේතුවෙනි. 2023 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 231.6 ක් වූ සමස්ත විශ්‍රාම වැටුප් ගෙවීම්, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය දී තුළ රු. බිලියන 254.0 දක්වා සියයට 9.7 කින් ඉහළ ගොස් ඇත.

### පොලී ගෙවීම්

විදේශීය හා දේශීය ණය සඳහා පොලී ගෙවීම් වියදම 2024 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 1,559.7 ක් වූ අතර, එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 1,525.7 ට සාපේක්ෂව සියයට 2.2 ක වැඩිවීමකි. විදේශීය ණය සඳහා පොලී ගෙවීම් 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 74.1 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 100.0 දක්වා සියයට 34.9 කින් ඉහළ ගොස් ඇත. මෙයට හේතුව ආංශික වශයෙන් ඇතැම් ද්විපාර්ශ්වික ණය ආපසු ගෙවීම ආරම්භ කිරීමයි. තව ද, 2023 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 1,451.6 ක් වූ දේශීය ණය සඳහා පොලී ගෙවීම්, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,459.7 දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත.

### සුබසාධන හා සහනාධාර ගෙවීම්

සමාජ සුබසාධන, සමාජ ආරක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය හා පෝෂණ සහ සංවර්ධන සහාය යන සුබසාධන වැඩසටහන් සඳහා 2024 වසර වෙනුවෙන් රු. බිලියන 1,055.7 ක් වෙන් කර ඇති අතර, එය රජයේ ප්‍රාථමික වියදමෙන් සියයට 15.4 ක් සහ ද. දේ. නි.යෙන් සියයට 3.5 ක් වේ. 2024 වසර සඳහා රු. බිලියන 1,055.7 ක් වූ ඇස්තමේන්තුව, 2023 වසරේ සත්‍ය වියදම වූ රු. බිලියන 915.4 ට සාපේක්ෂව සියයට 15.3 ක වැඩිවීමකි.

2024 වසරේ පළමු මාස අට තුළ රජයේ සුබසාධන වියදම රු. බිලියන 562.4 ක් වූ අතර, එයට, "අස්වැසුම" වැඩසටහන සඳහා වූ රු. බිලියන 112.7, පාසල් පෝෂණ ආහාර වැඩසටහන සඳහා වූ රු. බිලියන 9.5, "පෝෂණ මල්ල" වැඩසටහන සඳහා වූ රු. බිලියන 4.1, පාසල් පෙළපොත් හා නිල ඇඳුම් සඳහා වූ රු. බිලියන 4.4 සහ පොහොර සහනාධාරය සඳහා වූ රු. බිලියන 24.2 ඇතුළත් විය.

2024 වසරේ පළමු මාස අට තුළ දී වූ සමස්ත සුබසාධන වියදම, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වියදම වූ රු. බිලියන 544.3 සිට රු. බිලියන 562.4 දක්වා සියයට 3.3 කින් ඉහළ ගොස් ඇත. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සෞඛ්‍ය හා පෝෂණ වියදම් සියයට 83.9 කින් ඉහළ යාම සහ සංවර්ධන සහාය සියයට 12.4 කින් වර්ධනය වීමයි.

**වගුව 5 : රජය විසින් ක්‍රියාත්මක කරන ලද සුබසාධන හා සහන වැඩසටහන් සඳහා වියදම් සාරාංශය**

රු. මිලියන

| | 2023<br>තත්‍ය වියදම | 2024<br>ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව | 2023.08.31<br>වන විට තත්‍ය වියදම | 2024.08.31<br>වන විට තත්‍ය වියදම |
|---|---|---|---|---|
| සමාජ සුබසාධන | 188,525 | 220,660 | 110,377 | 120,056 |
| සමාජ ආරක්ෂණ | 566,170 | 622,190 | 343,183 | 336,179 |
| අධ්‍යාපනය සඳහා සුබසාධන වැඩසටහන් | 40,873 | 46,279 | 25,879 | 15,311 |
| සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධ සුබසාධනය | 21,576 | 32,302 | 8,621 | 15,851 |
| සංවර්ධන සහාය | 98,148 | 103,486 | 56,208 | 63,183 |
| වෙනත් | 63 | 30,804 | 1 | 11,783 |
| **මුළු වියදම** | **915,356** | **1,055,721** | **544,269** | **562,364** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## රාජ්‍ය ආයෝජන

රජය විසින් 2024 වසර සඳහා මාර්ග, පාලම්, කෘෂිකර්මාන්ත, වාරිමාර්ග, අධ්‍යාපනය, සෞඛ්‍ය, පානීය ජල සැපයුම සහ නාගරික සංවර්ධනය යන රාජ්‍ය ආයෝජන වෙනුවෙන් රු. බිලියන 1,260 ක් වෙන් කර ඇත. 2024 වසරේ පළමු මාස අට තුළ රාජ්‍ය ආයෝජන සඳහා රු. බිලියන 454.7 ක් වැය කර ඇති අතර, එය 2024 වසර සඳහා වූ ඇස්තමේන්තුවෙන් සියයට 26.6 ක් පිළිබිඹු කරයි. තවද, මෙය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 389.6 ට සාපේක්ෂව සියයට 16.7 ක වැඩිවීමකි. මාර්ග අංශය සඳහා සත්‍ය වියදමෙන් වැඩිම ප්‍රමාණයක් යොදවා ඇති අතර, එය 2024 වසරේ එම අංශයට වෙන් කරන ලද අරමුදල්වලින් සියයට 47 ක් පමණ වේ. තවද, මුළු ආයෝජනයෙන් වැඩිම ප්‍රමාණයක් වූ සියයට 25 ක් පමණ මාර්ග සංවර්ධනය සඳහා මෙම වසර තුළ වෙන් කර ඇති අතර, ඉන් පසුව වාරිමාර්ග සංවර්ධනය සඳහා සියයට 6 ක ප්‍රමාණයක් වෙන් කර ඇත.

වගුව 6 : ප්‍රාග්ධන ආයෝජනවල සංශෝධිත ඇස්තමේන්තු සහ තත්‍ය වියදම් සාරාංශය

රු. මිලියන

| | 2023<br>තත්‍ය වියදම | 2024<br>ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව | 2023.08.31<br>වන විට තත්‍ය වියදම | 2024.08.31<br>වන විට තත්‍ය වියදම |
|---|---|---|---|---|
| **මුළු ප්‍රාග්ධන වියදම** | **932,745** | **1,259,774** | **389,688** | **420,824** |
| එයින්, සෞඛ්‍ය | 26,115 | 64,635 | 11,565 | 12,246 |
| අධ්‍යාපන | 34,135 | 58,480 | 16,277 | 17,220 |
| මාර්ග | 226,907 | 320,857 | 166,495 | 150,051 |
| ප්‍රවාහන | 21,986 | 48,588 | 11,808 | 10,172 |
| වාරිමාර්ග | 45,890 | 79,529 | 23,764 | 27,081 |
| විදුලිබල හා බලශක්ති | 12,579 | 47,318 | 8,813 | 5,095 |
| ජල සම්පාදන | 48,006 | 71,432 | 27,453 | 14,091 |
| කෘෂිකර්ම හා වැවිලි | 36,148 | 47,077 | 14,803 | 15,810 |
| ආරක්ෂක | 26,666 | 58,645 | 13,142 | 15,235 |
| වරාය සහ නාවික | 1,839 | 8,108 | 1,823 | 244 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## 4.3 භාණ්ඩාගාර මෙහෙයුම්

2024 වර්ෂයේ අගෝස්තු අවසානය දක්වා වියදම් කළමනාකරණය කරමින් ආදායම් ප්‍රවාහය ඉහළ නැංවීම සඳහා දරන අඛණ්ඩ උත්සාහයන් හේතුවෙන් භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය තුළ ධනාත්මක ද්‍රවශීලතා තත්ත්වයක් පිළිබිඹු කරයි. ණය සේවා ගෙවීම් සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කරන අතරම ප්‍රශස්ත ලෙස අඩු මට්ටමක වෙළඳපොළ පොලී අනුපාත පවත්වාගැනීම සඳහා මුදල් අතිරික්තයන් සහාය විය. ඕනෑම අවස්ථාවකදී මාස තුනට වඩා වැඩි නොවන හිඟ බිල්පත් බිංදුවට පවත්වාගැනීමේ IMF-EFF ඉලක්කවලට අනුකූලවෙමින්, රජයේ භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු බිල්පත් කඩිනමින් පියවීම පුද්ගලික අංශයේ සැපයුම්කරුවන්ගේ මුදල් ප්‍රවාහ මෙහෙයුම් සඳහා උපකාරී වූ අතර එය සමස්ත ආර්ථිකය කෙරෙහි ධනාත්මකව බලපා ඇත.

## රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2024 වසරේ පළමු මාස අට තුළ ආදායම් සහ අනෙකුත් ලැබීම්වලින් භාණ්ඩාගාර මුදල් ගලා ඒම එහි වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 2,545.3 ට සාපේක්ෂව රු. බිලියන 2,496.8ක් වූ අතර එය අදාළ කාලපරිච්ඡේදය සඳහා අදාළ ඇස්තමේන්තුවෙන් සියයට 98 ක් ලඟා කර ගැනීමකි. අදාළ කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,167.8 ක ශුද්ධ මුදල් හිඟයක් ඇතිකරමින් පුනරාවර්තන සහ ප්‍රාග්ධන ගෙවීම් සඳහා සමස්ත මුදල් ගලායාම රු. බිලියන 3,664.7 ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2023 වසරේ පළමු මාස අටට සාපේක්ෂව සමාලෝචිත කාල සීමාව තුළ ශුද්ධ මුදල් හිඟය රුපියල් බිලියන 577.6 කින් අඩු වී ඇත. 2024 වසරේ අගෝස්තු මස 31 දිනට සමස්ත ධනාත්මක මුදල්/බැංකු ශේෂයක් පිළිබිඹු කරමින්, රාජ්‍ය ආදායම ඉහළ යාම හේතුවෙන් ශුද්ධ මුදල් හිඟයේ අඩුවීම ප්‍රධාන වශයෙන් සිදු විය.

**වගුව 7 : රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ මෙහෙයුම් (ජනවාරි - අගෝස්තු 2024)**

රු. බිලියන

| අයිතමය | ජනවාරි - අගෝස්තු | | |
|---|---|---|---|
| | 2023 | 2024 | |
| | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | -84.2 | 599.5 | 599.5 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ත මුදල් ගලා ඒම | 1,733.0 | 2,545.3 | 2,496.8 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ත මුදල් ගලා යෑම් | -2,949.2 | -3,383.9 | -3,065.0 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් * | -529.2 | -878.6 | -599.7 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -1,745.4 | -1,717.2 | -1,167.8 |
| දල ණය ගැනීම් භාවිතය * | 2,930.5 | 2,877.9 | 2,306.5 |
| ණය ආපසු ගෙවීම් | -1,017.5 | -856.1 | -924.6 |
| ශුද්ධ ණය ගැනීම් භාවිතය | 1,913.1 | 2,021.8 | 1,382.0 |
| පෙර වසරේ වාණිජ ණය ගැණීම් ශේෂය | – | – | – |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ශුද්ධ තැන්පතු යනාදිය) | 11.2 | – | -53.5 |
| **අවසාන මුදල් ශේෂය** | **94.6** | **904.1** | **760.1** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

** රජය විසින් ගිණුම්ගත කර ඇති ව්‍යාපෘති / වැඩසටහන් ණය ඇතුලත් වේ.*

## රජයේ ණය කළමනාකරණය

භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා විදේශ ණය මගින් වර්ෂය සඳහා අනුමත කර ඇති රු. බිලියන 7,350 ක් වූ දළ ණය ගැනීමේ සීමාව යටතේ රජය විසින් මුහුණත් වටිනාකම මත රු. බිලියන 1,881 ක ණය ලබා ගන්නා ලදී. දේශීය හා විදේශීය ණය සේවා ගෙවීම් රු. බිලියන

2,321 ක් වූ අතර එයින් රු. බිලියන 762 ක් ණය ආපසු ගෙවීම් සඳහා වන අතර, ඉතිරි රු. බිලියන 1,559 පොලී ගෙවීම සඳහා වේ.

වගුව 8 : රජයේ ණය සේවා ගෙවීම්

රු. බිලියන

| අයිතමය | **31.08.2024** දිනට |
|---|---|
| **ණය සේවා ගෙවීම්** | **2,321** |
| දේශීය | 2,114 |
| විදේශීය | 207 |
| **වාරික ගෙවීම් (අ)** | **762** |
| දේශීය | 655 |
| විදේශීය | 107 |
| **පොළී ගෙවීම්** | **1,559** |
| දේශීය | 1,459 |
| කෙටි කාලීන | 304 |
| මධ්‍ය කාලීන හා දිගුකාලීන | 1,155 |
| විදේශීය | 100 |

*මූලාශ්‍රය :භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

(අ) භාණ්ඩාගාර බිල්පත්වල වාරික ගෙවීම් ඇතුළත් නොවේ.

### භාණ්ඩාගාර ඇපකර මත වන වගකීම හෙළිදරව් කිරීම

2024 වසරේ අගෝස්තු මස 31 දිනෙන් අවසන්වන කාලය තුළ දී නිකුත් කළ හා වලංගුව පවතින භාණ්ඩාගාර ඇපකරවල වටිනාකම රු. බිලියන 2,251.2 කි. 2024 වසරේ අගෝස්තු මස 31 වන දින දක්වා නිකුත් කළ ඇපකර පිළිබඳ තොරතුරු ඇමුණුම I හි දැක්වේ.

### 4.4 විදේශ මූල්‍යනය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ දෙවන සමාලෝචනය 2024 වසරේ ජූනි මස 12 වන දින අවසන් කරන ලද අතර, ඒ අනුව, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා සහාය වීම හා සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම සඳහා දළ වශයෙන් ඇ .ඩො. මිලියන 334 ක තුන්වන වාරිකය ශ්‍රී ලංකාව වෙත ලැබුණි. 2023 වසරේ මාර්තු මස සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සිය මූල්‍ය සහාය යටතේ ඇ.ඩො. බිලියන 1.0 ක් ලබා දී ඇත. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන අනුමත කිරීම සහ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම, වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන වෙතින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ මූල්‍ය පහසුකම් සුරක්ෂිතකර ගැනීමට ද උපකාරී වී ඇත.

ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකාව 2024 වසරේ ජුනි මස 26 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රධාන ද්විපාර්ශ්වික ණය දෙන්නන් හා චීන එක්සිම් බැංකුවේ නිල ණයහිමි කමිටුවේ (OCC) සාමාජික රටවල් සමඟ සිය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ අවසන් ගිවිසුමකට එළඹෙන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් ඇතුළු පෞද්ගලික ණයහිමියන් සමඟ එකඟතාවයන් ඇති කරගෙන ඇති අතර, එම ක්‍රියාවලිය අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටී. මෙම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් සමඟ එකඟ වීමත් සමඟ, 2024 වසරේ ජූලි මස 24 වන දින ජපානය විසින් මූල්‍යනය කරනු ලබන ව්‍යාපෘති කළඹ සඳහා අරමුදල් උපයෝජනය කිරීම නැවත ආරම්භ කිරීමේ තීරණය ජපාන රජය විසින් නිල වශයෙන් නිවේදනය කරන ලදී.

## විදේශ මූල්‍යන එකඟතා

2024 වසරේ අගෝස්තු මස අවසන් වනවිට විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන, ශ්‍රී ලංකාව සමඟ විදේශ මූල්‍යන එකඟතා ගිවිසුම් 10 ක් මගින් ඇ.ඩො. මිලියන 398.7 ක එකඟතා ඇතිකරගෙන ඇති අතර, එයින් ඇ.ඩො. මිලියන 350.0 ක් ණය වශයෙන් ලබාගෙන ඇත. ජපාන හා ඕස්ට්‍රේලියා රජයන් සමඟ නිල සංවර්ධන ආධාර යටතේ ප්‍රදාන ගිවිසුම් 7 ක් මගින් ඇ. ඩො. මිලියන 48.7 ක පූර්ණ ප්‍රදාන එකඟතා ඇති කරගෙන ඇත.

**වගුව 9 : එක් එක් සංවර්ධන පාර්ශ්වකරු සමඟ 2024 වසරේ ජනවාරි මස 1 දින සිට අගෝස්තු 31 දින දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා**

| සංවර්ධන පාර්ශ්වකරු | විදේශ මූල්‍යයන එකඟතා ප්‍රමාණය (ඇ.ඩො. මිලියන) |
|---|---|
| **ද්විපාර්ශ්වික** | **48.7** |
| ඕස්ට්‍රේලියාව | 27.8 |
| ජපානය | 20.9 |
| **බහුපාර්ශ්වික** | **350.0** |
| ආසියානු සංවර්ධන බැංකුව | 200.0 |
| ලෝක බැංකුව | 150.0 |
| **එකතුව** | **398.7** |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන:*

*එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*

*විශේෂ ගැනුම් හිමිකම් විනිමය එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතතිකයන් භාවිත කර ඇත*

## විදේශ මූල්‍යන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට අගෝස්තු මස 31 වන දා දක්වා ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ. ඩො. මිලියන 1,005.7 කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ඇ. ඩො. මිලියන

994.4 ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර, ඇ. ඩො. මිලියන 11.3 ක් පූර්ණ ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි විය.

2024 වසර තුළ ලද මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද අතර, එය සමස්ත ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සියයට 36 ක් ද, අනතුරුව ඉහළම ප්‍රමාණයන් පිළිවෙලින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (සියයට 33) සහ ලෝක බැංකුව (සියයට 24) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

මෙම ප්‍රතිලබ්ධිවලින් වැඩි ප්‍රමාණයක් එනම් සියයට 33 කට ආසන්න ප්‍රමාණයක් අයවැය මූල්‍යකරණ අංශය සඳහා උපයෝජනය කර ඇති අතර, අනතුරුව විදුලිබල හා බලශක්ති අංශයේ ව්‍යාපෘතිවල සියයට 13 ක් ද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යාපෘතිවල සියයට 10 ක් ද, මූල්‍ය අංශයේ ව්‍යාපෘතිවල සියයට 7 ක් ද උපයෝජනය කර ඇත.

**වගුව 10 : එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2024 වසරේ ජනවාරි මස 1 දින සිට අගෝස්තු 31 දින දක්වා සිදු කරන ලද සත්‍ය ප්‍රතිලබ්ධි**

| සංවර්ධන පාර්ශ්වකරු | සත්‍ය ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වික** | **28.7** | **1.6** | **30.3** |
| ජපානය | 20.1 | 1.3 | 21.4 |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල | 5.2 | - | 5.2 |
| කොරියාව | 2.0 | - | 2.0 |
| නෙදර්ලන්තය | 1.4 | - | 1.4 |
| ජර්මනිය | - | 0.3 | 0.3 |
| **බහුපාර්ශ්වික** | **965.7** | **9.7** | **975.4** |
| ආසියානු සංවර්ධන බැංකුව | 356.1 | 2.2 | 358.3 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ** | 334.0 | - | 334.0 |
| ලෝක බැංකුව | 232.3 | 7.5 | 239.8 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 26.6 | - | 26.6 |
| ඔපෙක් අරමුදල | 12.7 | - | 12.7 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 4.0 | - | 4.0 |
| **එකතුව** | **994.4** | **11.3** | **1,005.7** |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන :*

** තාවකාලික අගයයන්, ප්‍රතිව්‍යුහගතකරණය කළ ණයවල ඇ.ඩො. මිලියන 200.9 ක ප්‍රාග්ධනීකරණය කළ නොගෙවූ පොලී සහ දඩ පොලිය ඇතුළත් නොවේ*

*එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් ඇ. ඩොලර් බවට හැරවීමේදී එක් එක් ප්‍රතිලබ්ධීන් සිදුවූ දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*

*** විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ. ඩොලර් හා රුපියල් බවට හැරවීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතතිකයන් භාවිත කර ඇත*

### එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය

බහුපාර්ශ්වීය ආයතන සමඟ දැනට පළ කර ඇති ණය එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 තුළදී උපයෝජනය වීමට නියමිත බහුපාර්ශ්වීය විදේශ මූල්‍යනවල ශේෂය, 2024 වසරේ අගෝස්තු මස 31 වන දින වනවිට ඇ.ඩො. මිලියන 1,696 ක් විය. මේ වනවිට ඇතිකරගත් ද්වීපාර්ශ්වික ණය එකඟතා අනුව ඉදිරි වර්ෂවල දී උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂයන්, ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තිය හේතුවෙන් බලපෑමට ලක්වී ඇත.

### විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2024 වසරේ අගෝස්තු මස 31 වන දින වන විට රජය ලබාගත් විදේශ ණය මූල්‍යනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය[1] ප්‍රමාණය ඇ.ඩො. බිලියන 38.1 කි.

2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට අගෝස්තු මස 31 වනදා දක්වා සිදු කරන ලද ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 676.4 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 350.6 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 325.8 ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

රජය විසින් අනුගමනය කරන ලද අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින සිට අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස 12 වැනි දින සිට 2024 වසරේ අගෝස්තු මස 31 වන දින දක්වා නොපියවා ඇති ණය වාරික ප්‍රමාණය ඇ.ඩො. මිලියන 5,784 ක් ද, පොලී ප්‍රමාණය[1] ඇ.ඩො. මිලියන 2,623 ක් ද විය.

### 4.5 රාජ්‍ය ණය

2024 වසරේ ජූනි මස අවසන් වන විට රජයේ සමස්ත නොපිය වූ ණය ප්‍රමාණය රු. බිලියන 28,563.4 ක් විය. මෙය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වූ රු. බිලියන 26,916.2 සිට සියයට 6.1 ක වර්ධනයකි. සමස්ත දේශීය ණය ප්‍රමාණය 2023 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ රු. බිලියන 15,961.4 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 17,555.2

---

*1 - තාවකාලික අගයයන්, මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.*
*- ණය සේවාකරණය තාවකාලිකව නතරකිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතුවූ නොගෙවූ ණය වාරිකද ඇතුළත් කර ඇත*
*- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර අන්තර්ගත වේ. එසේ වුවද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ගෙවීමට ඇති ණය ප්‍රමාණය එහි හිමිකාරිත්වයේ නේවාසික/ අනේවාසික තත්ත්වය මත වර්ගීකරණය කර නොමැත.*
*- චීන එක්සිම් බැංකුව විසින් ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය 39 ක ප්‍රාග්ධනීකරණය කරන ලද නොගෙවූ පොලී සහ දඩ පොලී හේතුවෙන් එකතු වූ ඇ.ඩො. මිලියන 9.200 ප්‍රමාණය ඇතුළත් වේ.*

*2. ණය සේවාකරණය = ණය ආපසු ගෙවීම + පොලී ගෙවීම*

*3. ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සම්මුති සාකච්ඡාවලදී එක් එක් ණයහිමියා සමඟ සැසඳීමට යටත්වේ.*

දක්වා සියයට 10 කින් වර්ධනය විය. 2023 වසරේ පළමු භාගය තුළ දී දේශීය ණය තොගයෙන්, රු. බිලියන 5,140.9 ක් වූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,883.1 දක්වා සියයට 24.5 කින් සැළකිය යුතු ලෙස අඩු විය. කෙසේ වුවද, භාණ්ඩාගාර බැඳුම්කර තොගය 2023 වසරේ පළමු භාගය තුළ දී වූ රු. බිලියන 9,019.9 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 12,767.1 දක්වා සියයට 41.5 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය.

වගුව 11 : රාජ්‍ය ණය

රු. බිලියන

| අයිතමය | 2022 | 2023 | 2023 ජූනි අවසානය | 2024 ජූනි අවසානය |
|---|---|---|---|---|
| **මුළු දේශීය ණය** | **12,822.96** | **17,051.85** | **15,961.41** | **17,555.21** |
| එයින් ; භාණ්ඩාගාර බිල්පත් | 4,113.91 | 4,017.04 | 5,140.94 | 3,883.09 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 8,709.06 | 12,002.34 | 9,019.97 | 12,767.06 |
| **මුළු විදේශීය ණය** | **12,458.16** | **11,644.09** | **10,954.82** | **11,008.23** |
| **මුළු ණය** | **25,281.12** | **28,695.94** | **26,916.23** | **28,563.44** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

## 5. ආර්ථිකයේ ඉදිරි දැක්ම

සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණයන් සහ ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රගතිය හේතුවෙන් නුදුරු කාලීන ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්ම අපේක්ෂා සහගත බව පෙනේ. 2023 වසරේ තුන්වන කාර්තුවේ සිට ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුල පිළිබිඹු වූ ධනාත්මක වර්ධන ප්‍රවණතාවය 2024 වසර මුළුල්ලේ ද අඛණ්ඩව පවතිනු ඇති අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සියයට 2 ක් වූ වර්ධන ඉලක්කය ද ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කළ හැක. ක්‍රමාණුකූලව වැටුප් ගැලපීමත් සමඟ ඉල්ලුමෙහි වර්ධනයක් අපේක්ෂා කළ හැකි අතර, එය සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් සඳහා දායකත්වය ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, ඉදිරි මැතිවරණ හමුවේ විශේෂයෙන් නිශ්චිතව හා අඛණ්ඩව ප්‍රතිපත්ති පවත්වා ගැනීම ඉතා වැදගත් වනු ඇත. පාලන දුර්වලතා සහ දූෂණ අවදානම් විසඳාලීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම ආර්ථික හා සමාජීය ප්‍රගමනය සඳහා අත්‍යාවශ්‍ය වේ. පාලනය ශක්තිමත් කිරීම මඟින් ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු වනවා පමණක් නොව තිරසාර වර්ධනය හා සංවර්ධනය නංවාලීම මඟින් ආර්ථික ප්‍රතිලාභ ජනගහණයෙන් බහුතරයක් කරා ලඟාකරවීම සහතික කරනු ඇත.

ඉදිරි මාස කිහිපය තුළ උද්ධමනය, සියයට 5 ඉලක්කයට වඩා සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසර මුළුල්ලේ උද්ධමනය සාමාන්‍යයෙන් සියයට 5 ඉලක්කයට වඩා අඩු මට්ටමක පැවතිය හැකි අතර, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් මඟින් මැදිකාලීනව ඉලක්කගත මට්ටම වෙත ක්‍රමානුකූලව ලඟා වනු ඇතැයි අපේක්ෂා කළ හැක. මහ බැංකුවේ ස්වාධීනත්වය සමඟ වැඩිදියුණු වූ ඉහළ මහජන වගවීම සහ රාජ්‍ය මූල්‍ය

කළමනාකරණ පනතේ සහායයෙන් රාජ්‍ය මූල්‍ය විනය වැඩිදියුණුවීම මඟින් මධ්‍යකාලීනව උද්ධමනය පිටුදැකීමටත්, තිරසාර වර්ධනය සඳහා දායකවීමටත් ස්ථාවර ක්‍රමවේදයක් තහවුරු කරනු ඇත.

සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම, ශ්‍රමික ප්‍රේෂණ ශක්තිමත් මට්ටමක පැවතීම හා ණය නොවන ලැබීම් වැඩිදියුණු වීම හේතුවෙන් 2024 වසරේ විදේශීය අංශයේ ස්වාරක්ෂක වර්ධනය වීමක් අපේක්ෂා කළ හැක. අපනයන ඉපැයීම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම හා ප්‍රසාරණය වීම මඟින් මධ්‍ය කාලීනව වෙළෙඳ හිඟය කළමනාකරණය කළ හැකි මට්ටමක් කරා ලඟාවනු ඇතැයි  අපේක්ෂා කෙරේ.  2024 වසර හා ඉන් ඔබ්බට ශ්‍රමික ප්‍රේෂණ ඉතා ඉහළ මට්ටමක පැවතීමේ හැකියාවක් ඇත. අපේක්ෂිත මට්ටමට වඩා වේගවත්ව සංචාරක අංශය යථා තත්ත්වයට පත්වීම අනෙකුත් ආශ්‍රිත අංශ සඳහා ද ධනාත්මක බලපෑමක් ඇති කරමින් නුදුරු කාලයේ දී ආර්ථික වර්ධනය වේගවත් කිරීමට උපකාරී වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම මඟින් ආයෝජකයන්ගේ සුභවාදී අපේක්ෂාවන් ධනාත්මක ලෙස වර්ධනය වීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත ලැබීම් වැඩිවනු ඇතැයි අපේකෂා කළ හැක. ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව වැනි බහුපාර්ශ්වික ආයතන මඟින් ලැබෙන සහාය සමඟ ද්වි පාර්ශ්වික මූල්‍යනය සහායද නැවත ලැබීම් වැඩිවනු ඇතැයි අපේක්ෂා කළහැක. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව වැනි බහුපාර්ශ්වික ආයතන මඟින් ලැබෙන සහාය සමඟ ද්වීපාර්ශවික මූල්‍යනය සහායද නැවත ලැබීමට අපේක්ෂිත බැවින්, 2024 වසර සහ ඉන් ඔබ්බට ලැබීම් වර්ධනය වී දළ නිල සංචිත ශක්තිමත් වනු ඇත. පාලන ප්‍රතිසංස්කරණයන්ගේ වැඩිදියුණුවීමත් සමඟ  මැදිකාලීනව විශේෂයෙන් ඍජු විදේශීය ආයෝජන වැනි ණය නොවන විදේශීය ලැබීම් ශක්තිමත් වීම අපේක්ෂා කෙරේ. ආයෝජන ප්‍රවර්ධන අවස්ථා ශක්තිමත් කිරීම සඳහා ප්‍රයත්න දැරීම සහ ව්‍යාපාරික පරිසරයේ පැවති දිගුකාලීන අභියෝග විසඳීම මඟින් ආයෝජකයින් අතර ශ්‍රී ලංකාව පිළිබඳව ඇති ආකල්ප වැඩිදියුණු  කළහැකි අතර, එය තවදුරටත් ආර්ථික වර්ධනය සඳහා සහාය ලබාදෙනු ඇත.

හිතකර උද්ධමන තත්ත්වයන් සහ නුදුරු කාලය තුළ ඉදිරි දැක්ම ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය දක්වනු ඇතැයි අපේක්ෂා කළ හැක. ලිහිල් මුදල් ප්‍රතිපත්තිමය තත්ත්වයන් සහ ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය නොකඩවා ක්‍රියාත්මක වුවහොත් දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය වැඩිදියුණු වී රජයේ සුරැකුම්පත් අවදානම් අධිමිල අඩු වී, වෙළෙඳපොළ පොලී අනුපාතික, විශේෂයෙන්ම ණය පොලී අනුපාතික තවදුරටත් සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සාමාන්‍යකරණය මඟින් මූල්‍ය පිරිවැය අඩු කර ව්‍යාපාර සහ කුටුම්භ සඳහා අත්‍යාවශ්‍ය සහන සලසා දෙනු ඇති අතර තවදුරටත් ආර්ථික වර්ධනය ශක්තිමත් කරනු ඇත.

## 6. අයවැය දැක්ම 2024

2024 වසරේ අයවැය, ආර්ථික හා අනෙකුත් උපකල්පන ගණනාවක් මත පදනම් විය. 2023 වසරේ නොවැම්බර් මස අයවැය සම්පාදනය කරන විට, 2022 වසරේ දී ඇති වූ ආර්ථික අර්බුදයෙන් යථා තත්ත්වයට පත් වීමේ ලක්ෂණ පෙනෙන්නට තිබිණ.

2024 වසරේ අයවැය සැකසීමේ දී පහත දැක්වෙන උපකල්පන පදනම් කර ගන්නා ලදී.

- ආර්ථිකයේ අංශ තුනෙහිම වර්ධනයක් සහිතව ආර්ථිකය සියයට 1.8 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරිණ. 2023 වසරට සාපේක්ෂව ප්‍රධාන අමුද්‍රව්‍ය වැඩි වශයෙන් හා අඛණ්ඩව ලබා ගත හැකි වීම හේතුවෙන් කාර්මික හා කෘෂිකාර්මික යන අංශ දෙකම යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරිණි. තවද, සේවා අංශය අඛණ්ඩ ආර්ථික පුනර්ජීවනය සමඟ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරිණි.

- උද්ධමනය මධ්‍යස්ථ තනි අගයක මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරිණි. විරැකියා අනුපාතය සියයට 5 ට වඩා අඩුවෙන් පවත්වා ගැනීමට අපේක්ෂා කෙරිණි.

- අපනයන ඉපැයීම්වල, සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායමෙහි සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල අපේක්ෂිත වැඩි වීම සමඟ 2024 වසරේ දී විදේශ අංශය වඩාත් ශක්තිමත්ව ස්ථාවර වනු ඇතැයි පුරෝකථනය කර තිබුණි. ඒ අනුව, විනිමය අනුපාතය ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරිණි. මුදල් සැපයුම ද සුදුසු මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරිණි.

### 6.1 ආදායම

2024 අයවැය අනුව, ප්‍රදාන ඇතුළුව සමස්ත ආදායම සඳහා වන ඇස්තමේන්තුව රු. බිලියන 4,127 ක් වූ අතර, ඉන් බදු ආදායම සඳහා ඇස්තමේන්තුව රු. බිලියන 3,820 ක් ද, බදු නොවන ආදායම සඳහා ඇස්තමේන්තුව රු. බිලියන 287 ක් ද, ප්‍රදාන සඳහා ඇස්තමේන්තුව රු. බිලියන 20 ක් ද වේ.

2024 වසරේ ආරම්භයේ සිට ක්‍රියාත්මක කරන ලද නව ආදායම් ක්‍රියාමාර්ග, පාඩු ලබන රජය සතු ව්‍යවසායන් ඉලක්ක කර ගනිමින් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, සහ ආදායම් පරිපාලන හා ඩිජිටල්කරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මත අපේක්ෂිත ආදායම් ඉහළ යාම පදනම් විය.

2024 වසරේ පළමු මාස අට තුළ, අයවැය මඟින් අපේක්ෂා කළ සියයට 20.8 ක වර්ධනයට වඩා සියයට 40.5 ක වර්ධන වේගයකින් ප්‍රදාන ද ඇතුළත් ව සමස්ත ආදායම වර්ධනය වී ඇත. බදු ආදායම ද අයවැයෙන් අපේක්ෂිත සියයට 22.0 ක වර්ධනයට වඩා සියයට 41.4 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. ප්‍රධාන බදු ආදායම් වර්ග තුන සලකා බැලීමේ දී, ආදායම් බදු ආදායමේ වර්ධනය පමණක් අයවැයෙන් අපේක්ෂිත වර්ධනයට වඩා මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර එය 2024 වසරේ ඉතිරි මාස හතර තුළ සංස්ථාපිත ආදායම් බදු සහ පුද්ගල ආදායම් බදු සඳහා වන ඉතිරි ගෙවීම් දෙක ලැබීමත් සමඟ අයවැයෙන් අපේක්ෂිත මට්ටමට ලඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වගුව 12: ආදායම් කාර්යසාධන තක්සේරුව - 2024

රු. බිලියන

| දර්ශක | 2023 | | 2024 | | ඇස්තමේන්තුගත වර්ධනය | ජන.- අගෝ. වර්ධනය | 2024 ළඟාකර ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | වාර්ෂික | ජන.- අගෝ. | වාර්ෂික | ජන.- අගෝ. ඇස්තමේන්තුගත | % | % | (ඇස්ත-මේන්තුවේ ප්‍රතිශතයක් ලෙස) |
| **ආදායම් හා ප්‍රදාන** | **3,415.0** | **1,826.6** | **4,127.0** | **2,565.9** | **20.8** | **40.5** | **62.2** |
| **ආදායම** | **3,408.0** | **1,820.0** | **4,107.0** | **2,557.8** | **20.5** | **40.5** | **62.3** |
| **බදු ආදායම** | **3,130.0** | **1,661.2** | **3,820.0** | **2,348.5** | **22.0** | **41.4** | **61.5** |
| ආදායම් බදු | 912.0 | 537.2 | 1,080.0 | 624.7 | 18.4 | 16.3 | 57.8 |
| භාණ්ඩ හා සේවා මත බදු | 1,763.0 | 889.5 | 2,235.0 | 1,421.3 | 26.8 | 59.8 | 63.6 |
| විදේශ වෙළෙඳාම මත බදු | 455.0 | 234.5 | 505.0 | 302.5 | 11.0 | 29.0 | 59.9 |
| **බදු ආදායම** | **278.0** | **158.8** | **287.0** | **209.3** | **3.2** | **31.7** | **72.9** |
| **ප්‍රදාන** | **7.0** | **6.6** | **20.0** | **8.1** | **185.7** | **22.6** | **40.6** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

2024 වසරේ පළමු භාගය තුළ, සමස්ත ආදායම හා ප්‍රදාන රු. බිලියන 1,864.6 ක් වූ අතර එය ද. දේ. නි.යෙන් සියයට 12.7 ක් වේ. 2024 සඳහා ඇස්තමේන්තුගත ද. දේ. නි.යෙන් සියයට 13.1 ක් වන ආදායම ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇති බව එමඟින් පෙන්නුම් කරයි.

## 6.2 වියදම

2024 වසර සඳහා රජයේ වියදම රු. බිලියන 6,978 ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇති අතර, එයට බැංකු ප්‍රාග්ධනීකරණය සඳහා වෙන් කරන ලද රු. බිලියන 450 ද ඇතුළත් විය. කෙසේ වෙතත්, මෙම වෙන් කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ අදාළ ඉලක්කවලින් බැහැර කර ඇති බැවින් පහත විශ්ලේෂණයේ දී එය සලකා නොබලයි. බැංකු ප්‍රාග්ධනීකරණය සඳහා වූ වෙන් කිරීම හැර, පුනරාවර්තන වියදම් සඳහා රු. බිලියන 5,277 ක් ද, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් වශයෙන් රු. බිලියන 1,251 ක් ද වෙන් කර ඇත.

පුරෝකථනය කරන ලද රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව හා විශ්‍රාමිකයන් සංඛ්‍යාව, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සඳහා වන වියදම්වල අපේක්ෂිත ඉහළ යාම, පොලී ගෙවීම් සඳහා පුරෝකථනය කරන ලද වියදම, භාණ්ඩ හා සේවා සඳහා වන පුරෝකථනය කළ වියදම, රාජ්‍ය ආයතන වෙත සිදු කරන මාරුකිරීම්වල පුරෝකථනය මධ්‍යස්ථ වැඩිවීම සහ රාජ්‍ය ආයෝජනවල අපේක්ෂිත

වැඩිවීම් වැනි උපකල්පන කිහිපයක් මත 2024 වසර සඳහා වන වියදම් ඇස්තමේන්තු පදනම් වී ඇත.

2024 වසරේ පළමු මාස අට තුළ, සියලුම පුනරාවර්තන වියදම් කාණ්ඩ අයවැයෙන් අපේක්ෂිත වර්ධනයට වඩා මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, පොලී ගෙවීම් සඳහා වන වියදම 2024 වසරේ පළමු මාස අට තුළ අයවැයෙන් අපේක්ෂිත සියයට 20.9 ක වර්ධනයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස සියයට 2.2 ක අඩු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2024 වසරේ පළමු මාස අට තුළ, රාජ්‍ය ආයෝජන අයවැයෙන් අපේක්ෂිත සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 16.7 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වන වියදමෙහි ඉහළ යාමයි.

**වගුව 13: වියදම් කාර්යසාධන තක්සේරුව - 2024**

රු. බිලියන

| දර්ශක | 2023 | | 2024 | | ඇස්තමේන්තුගත වර්ධනය | ජන.- අගෝ. වර්ධනය | 2024 ළඟාකර ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | වාර්ෂික | ජන.- අගෝ. | වාර්ෂික (අ) | ජන.- අගෝ. ඇස්තමේන්තුගත | % | % | (ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස) |
| **මුළු වියදම** | **5,819** | **3,297** | **6,528** | **3,477** | **12.2** | **5.4** | **53.3** |
| **පුනරාවර්තන වියදම්** | **4,609** | **2,942** | **5,277** | **3,042** | **14.5** | **3.4** | **57.6** |
| **පොලී නොවන පුනරාවර්තන වියදම්** | **2,416** | **1,416** | **2,626** | **1,482** | **8.7** | **4.6** | **56.4** |
| වැටුප් හා වේතන | 1,002 | 618 | 1,127 | 660 | 12.5 | 6.7 | 58.5 |
| භාණ්ඩ හා සේවා | 300 | 184 | 341 | 199 | 13.7 | 8.2 | 58.2 |
| සහනාධාර හා පැවරුම් | 1,114 | 614 | 1,158 | 624 | 3.9 | 1.5 | 53.9 |
| **පොලී ගෙවීම්** | **2,193** | **1,526** | **2,651** | **1,560** | **20.9** | **2.2** | **58.8** |
| **ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම්** | **1,210** | **356** | **1,251** | **435** | **3.4** | **22.4** | **34.8** |
| එයින්; රාජ්‍ය ආයෝජන | 1,220 | 390 | 1,260 | 455 | 3.3 | 16.7 | 36.1 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) IMF වැඩසටහන යටතේ අදාල ඉලක්ක වලින් බැහැර කර ඇති රු.බිලියන 450 ක් වූ බැංකු ප්‍රාග්ධනීකරණ වෙන්කිරීම් 2024 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තු තුළ ඇතුළත් කර නොමැත*

## 6.3 රාජ්‍ය මූල්‍ය ශේෂයන් සහ මූල්‍යකරණය

2024 මූල්‍ය වර්ෂය සඳහා, බැංකු ප්‍රාග්ධනීකරණය සඳහා වන රු. බිලියන 450 ක වෙන් කිරීම ද ඇතුළුව රු. බිලියන 2,851 ක අයවැය හිඟයක් අයවැය මඟින් අපේක්ෂා කරන ලදී. 2024 වසරේ පළමු මාස අට තුළ , රු. බිලියන 911 ක අයවැය හිඟයක් වාර්තා වී ඇති අතර එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 1,470.7 ක හිඟයට සාපේක්ෂව සැලකිය යුතු අඩුවීමකි.

ප්‍රාථමික ශේෂය ද, 2023 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 55 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 648.8 ක් දක්වා සැළකිය යුතු ලෙස වැඩි විය. 2024 වසරේ පළමු මාස හය තුළ, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.7 ක ප්‍රාථමික ශේෂයක් වාර්තා වී ඇති අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ දෙවන සමාලෝචනය යටතේ නියම කර ඇති සියයට 1.0 ක ප්‍රාථමික ශේෂය සපුරා ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් ශක්තිමත් ලෙස සිදු වන බව මෙමඟින් පෙන්නුම් කරයි.

2024 මුදල් වර්ෂය සඳහා ශුද්ධ පදනම මත රු. බිලියන 2,851 ක ණය ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. ශුද්ධ පදනම මත රු. බිලියන 726 ක මුළු විදේශීය ණය ගැනීම් අපේක්ෂා කරන අතර බිලියන 2,125 ක ඉතිරි ණය ගැනීම් දේශීය මූලාශ්‍රවලින් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

## 6.4 අවදානම් පිළිබඳ ප්‍රකාශය

මෙම වාර්තාව සම්පාදනය කරන අවස්ථාවේ 2024 වසර සම්පූර්ණ වීමට තිබෙන්නේ මාස තුනක පමණ කාලයක් වුව ද, වාර්ෂික අයවැය ඇස්තමේන්තු සම්පූර්ණ වශයෙන් ළඟා කර ගැනීමට හේතු විය හැකි අවදානම් ගණනාවක් පවතියි.

- මැද පෙරදිග භූ-දේශපාලනික උණුසුම් තත්ත්වයන් හේතුවෙන් ගෝලීය වර්ධනය මන්දගාමී වීම.
- ශ්‍රී ලංකා භාණ්ඩ සඳහා වන විදේශීය ඉල්ලුමට ද බලපෑම් ඇති කිරීමේ හැකියාව සහිතව, ආනයන පිරිවැය, දේශීය පාරිභෝගික මිල ගණන්, නිෂ්පාදන පිරිවැය මෙන්ම අයවැය පිරිවැයට ද අහිතකර ලෙස බලපෑ හැකි පරිදි විශේෂයෙන් ඛනිජ තෙල් මිල ඇතුළු ගෝලීය භාණ්ඩ මිල ගණන් ඉහළ යාම.
- දේශීය නිෂ්පාදනය, ජාත්‍යන්තර වෙළඳාම, දේශීය මිල ගණන් සහ සමස්ත වර්ධනයට බලපෑම් ඇති කළ හැකි විදේශ කම්පනයන්ට අනුකූලව අදාළ ගැලපීම් සිදු කිරීමේ පිරිවැය ඉහළ යාම.
- කෘෂිකර්මාන්තය, ජල විදුලි උත්පාදනය සහ රජයේ අයවැයට අහිතකර ලෙස බලපෑ හැකි ස්වාභාවික ආපදා සහ අහිතකර කාලගුණික තත්ත්වයන් හා සම්බන්ධ අවදානම්.
- පරිපාලනය සහ ප්‍රසම්පාදනයේ බාධා සහ ප්‍රමාදයන්.
- දේශීය සහ ගෝලීය උද්ධමනයේ වර්ධනයන් සමඟ පුනරාවර්තන වියදම් ඉහළ යාම.

මෙම සාධකවල සමස්ත බලපෑම ආදායම් උත්පාදනය සහ සංවර්ධන/මෙහෙයුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම මන්දගාමී කිරීමට, පුනරාවර්තන වියදම් වැඩි කිරීමට, රාජ්‍ය මූල්‍ය හිඟයන් සහ රජයේ ණය ගැනීම් මට්ටම කෙරෙහි බලපෑම් ඇති කිරීමට හේතු විය හැකිය.

ඇමුණුම I : මහා භාණ්ඩාගාරය විසින් 2024.08.31 දින දක්වා නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව

| අනු අංකය | ආයතනයේ නම | බැංකුව හෝ ආයතනයේ නම | නිකුතු වටිනාකම රු. මිලියන 30.08.2024 දිනට | එකතුව රු.මිලියන |
|---|---|---|---|---|
| 1 | සී /ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | හොංකොන් ඇන්ඩ් ෂැංග්හයි බැංකුව | 13,444 | |
| | | හැටන් නැෂනල් බැංකුව | 4,000 | |
| | | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) | 157,305 | 174,749 |
| 2 | ලංකා විදුලිබල මණ්ඩලය | ආසියානු සංවර්ධන බැංකුව | 121,833 | |
| | | ලංකා බැංකුව | 4,540 | |
| | | මහජන බැංකුව | 15,333 | |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 5,000 | |
| | | හැටන් නැෂනල් බැංකුව | 3,748 | |
| | | චීනයේ කර්මානත්ත හා වාණිජ බැංකුව | 12,784 | 163,238 |
| 3 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ලංකා බැංකුව | 100,000 | |
| | | මහජන බැංකුව | 2,353 | |
| | | චයිනා නැෂනල් කෙමිකල් ඉංජිනියරින් නො. 14, කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ලිමිටඩ් | 13,333 | 115,686 |
| 4 | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | මහජන බැංකුව | 21,903 | 21,903 |
| 5 | ලංකා ධීවර සංස්ථාව | ලංකා බැංකුව | 250 | 250 |
| 6 | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | ලංකා බැංකුව | 835 | |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 40,309 | 41,144 |
| 7 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | ලංකා බැංකුව | 200 | 200 |
| 8 | සීමාසහිත ලංකා කෝල් කම්පැණි පුද්ගලික සමාගම | මහජන බැංකුව | - | |
| | | ලංකා බැංකුව | 49,500 | 49,500 |
| 9 | සීමාසහිත ලංකා සතොස | මහජන බැංකුව | 2,241 | 2,241 |
| 10 | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය | ලංකා බැංකුව | 8,600 | 8,600 |

ඇමුණුම I : මහා භාණ්ඩාගාරය විසින් 2024.08.31 දින දක්වා නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව

| අනු අංකය | ආයතනයේ නම | බැංකුව හෝ ආයතනයේ නම | නිකුතු වටිනාකම රු. මිලියන 30.08.2024 දිනට | එකතුව රු.මිලියන |
|---|---|---|---|---|
| 11 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ලංකා බැංකුව | 65,892 | |
| | | කොමර්ෂල් බැංකුව | 968 | |
| | | චීන සංවර්ධන බැංකුව | 50,259 | |
| | | ඩී.එෆ්.සී.සී. බැංකුව | 6,026 | |
| | | ඉන්දියා එක්සිම් බැංකුව | 78,186 | |
| | | හැටන් නැෂනල් බැංකුව | 15,457 | |
| | | අයි. එන්. ජී. බෑන්ක්, එන් වී ඔෆ් නෙදර්ලර්න්ඩ්ස් | 28,123 | |
| | | ජාතික සංවර්ධන බැංකුව | 17,380 | |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 36,711 | |
| | | මහජන බැංකුව | 7,149 | |
| | | යුනික්‍රෙඩිට් බෑංක් ඔස්ට්‍රියා එජී | 17,155 | 323,307 |
| 12 | වී අලෙවි මණ්ඩලය | ලංකා බැංකුව | 363 | |
| | | මහජන බැංකුව | 759 | 1,122 |
| 13 | මාර්ග සංවර්ධන අධිකාරිය | ලංකා බැංකුව | 147,102 | |
| | | කොමර්ෂල් බැංකුව | 4,756 | |
| | | ඩී.එෆ්.සී.සී. බැංකුව | 5,897 | |
| | | හැටන් නැෂනල් බැංකුව | 20,133 | |
| | | ජාතික සංවර්ධන බැංකුව | 6,299 | |
| | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 114,416 | |
| | | මහජන බැංකුව | 56,998 | |
| | | සම්පත් බැංකුව | 14,500 | 370,101 |
| 14 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 3,500 | 3,500 |
| 15 | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව | ලංකා බැංකුව | 1,127 | 1,127 |
| 16 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | ලංකා බැංකුව | 2,400 | 2,400 |
| 17 | නාගරික සංවර්ධන අධිකාරිය | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 2,770 | 2,770 |

ඇමුණුම I : මහා භාණ්ඩාගාරය විසින් 2024.08.31 දින දක්වා නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව

| අනු අංකය | ආයතනයේ නම | බැංකුව හෝ ආයතනයේ නම | නිකුතු වටිනාකම රු. මිලියන 30.08.2024 දිනට | එකතුව රු.මිලියන |
|---|---|---|---|---|
| 18 | සීමාසහිත නෝර්ත් සී ආයතනය | ලංකා බැංකුව | 39 | |
| | | සීමාසහිත ජාතික ලංකා ඉතිරි කිරීමේ බැංකුව | 60 | 99 |
| 19 | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | චීන එක්සිම් බැංකුව | 27,003 | 27,003 |
| 20 | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | මහජන බැංකුව | 1,165 | 1,165 |
| 21 | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | ලංකා බැංකුව | 500 | 500 |
| 22 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 3,655 | 3,655 |
| 23 | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | ලංකා බැංකුව | 1,523 | |
| | | මහජන බැංකුව | 14,413 | |
| | | ඩී. බී. ට්‍රස්ටීස් හොංකොං ලිමිටඩ් | 53,302 | |
| | | ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) | 3,533 | 72,771 |
| 24 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | ලංකා බැංකුව | 93 | 93 |
| 25 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | මහජන බැංකුව | 100 | 100 |
| 26 | ජාතික කඩදාසි සංස්ථාව | මහජන බැංකුව | 140 | 140 |
| 27 | ලංකා බැංකුව හා මහජන බැංකුව | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 54,825 | 54,825 |
| 28 | ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 750 | |
| | | මහජන බැංකුව | 750 | 1,500 |
| 29 | ප්‍රාදේශීය සංවර්ධණ බැංකුව | ආසියානු සංවර්ධන බැංකුව | 15,229 | 15,229 |
| 30 | ශ්‍රී ලංකා මහ බැංකුව | ඉන්දියානු සංචිත බැංකුව | 792,350 | 792,350 |
| | | **එකතුව** | 2,251,266 | 2,251,266 |

ඇමුණුම II : මහා භාණ්ඩාගාරය විසින් 2024.08.31 දින දක්වා නිකුත් කරන ලද සහන ලිපි ලැයිස්තුව

| අනු අංකය | ආයතනයේ නම | බැංකුව හෝ ආයතනයේ නම | නිකුතු වටිනාකම රු. මිලියන 31.08.2024 දිනට |
|---|---|---|---|
| 1 | සීමාසහිත ලංකා සතොස | මහජන බැංකුව | 6,000 |
| 2 | සමුපකාර තොග ආයතනය | වී අලෙවි මණ්ඩලය | 880 |
| 3 | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | ලංකා බැංකුව | 43,358 |
| | | මහජන බැංකුව | 43,808 |
| 4 | මිහින් ලංකා ලිමිටඩ් | ලංකා බැංකුව | 3,173 |
| | | මහජන බැංකුව | 3,173 |
| 5 | අපනය සංවර්ධන මණ්ඩලය | ලංකා බැංකුව හා මහජන බැංකුව | 60 |
| | එකතුව | | **100,452** |